මිහිරි සරුඵල

இனிமையான வெற்றி

Sweet Success







වාර්ෂික ගිණුම් වාර්තාව -2013

வருடாந்த அறிக்கை -2013

Annual Report -2013

සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය
சீனி உற்பத்தி அபிவிருந்தி அமைச்சு
Ministry of Sugar Industry Development

සීමාසහිත ලංකා සීනි සමාගම
லங்கா சீனி நிறுவனம் விமிட்டெட்
Lanka Sugar Company (Private) Limited.



සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

වාර්ෂික වාර්තාව 2013

සීමාසහිත ලංකා සීනි සමාගම

127, මෙල්බෝර්න් ඇවනිව්, කොළඹ 4, ශ්‍රී ලංකා

දුරකථන: +94 11 523 2583 ෆැක්ස්: +94 11 250 0674

ඊ මේල් : infosugarsrilanka@gmail.com

(මුල් පිටපතේ සිංහල අනුවාදයකි)

මිහිරි සඵලත්වය

කරා ගමනාරම්භයක්



අන්තර්ගතය

අපගේ චින්තනය, ඉදිරි දැක්ම, ඉලක්ක, උපාය මාර්ග, පර්යේෂණ සහ සංවර්ධනය, සංස්ථානික ප්‍රජා වගකීම්	4
අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රකාශය, ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රකාශය, ගරු අමාත්‍ය ලක්ෂමන් සෙනවිරත්න මැතිතුමාගේ ප්‍රකාශය	5
මූල්‍යමය සහ මෙහෙයුම් ක්‍රියාදාමයන් තුල ඉස්මතුවූ සංසිද්ධීන්	7
සභාපතිතුමාගේ ප්‍රකාශය	9
ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ ප්‍රකාශය	10
අවදානම් කළමනාකරණය	11
අප සංස්කෘතිය සහ සාරධර්ම	13
අභ්‍යන්තර විගණන වාර්තාව	14 - 15
අධ්‍යක්ෂ මණ්ඩලය	17 - 18
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායමේ සහ සංවිධානයේ ව්‍යුහ	20 - 24
සංස්ථානික ප්‍රජා වගකීම්	25
ස්වාධීන විගණකවරයාගේ වාර්තාව	26 - 27
සමස්ථ ආදායම් ප්‍රකාශනය	28
මූල්‍යමය තත්වය සම්බන්ධව ප්‍රකාශනය	29
ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය	30
මුදල් සංසරණ ප්‍රකාශනය	31
මූල්‍යමය ප්‍රකාශණවලට අදාල සටහන්	32 - 52
ඛණ්ඩ වශයෙන් මූල්‍යමය තොරතුරු - සෙවනගල සහ පැල්වත්ත	53 - 60
ඛණ්ඩ වශයෙන් ප්‍රස්තාරික මූල්‍යමය සැසඳීම - සෙවනගල සහ පැල්වත්ත	61
රැස්වීම පිළිබඳ දැනුවත් කිරීම	62
පෙරකලාසිය	63
සංස්ථානික තොරතුරු	64

අපගේ චින්තනය

ග්‍රාමීය ආර්ථිකය වැඩිදියුණු කිරීමෙන් ජාතික සංවර්ධනයට දායක වීම තුලින් සීනි මත පදනම්වූ ගොවිතැන් සහ කර්මාන්ත හරහා කෘෂිකාර්මිකයන්ගේ ප්‍රජා ආර්ථික තත්වය උසස් කිරීම

අපගේ ඉදිරි දැක්ම

2019 වන විට සීනි සැපයුමින් ස්වයංපෝෂිත වීම

අපගේ ඉලක්ක

333 පරමාර්ථය - කෙටි කාලීන - (2015 තෙක් වසර 3කට)

1) මෙට්‍රික් ටොන් 300,000ක සීනි නිෂ්පාදනයක් සාක්ෂාත් කරගැනීම.
2) ගොවිතැනෙහි යෙදෙන පවුල් 50,000ක් නඩත්තු කිරීම.
3) සෘජු රැකියා අවස්ථා 9,000ක් සැපයීම.
4) කෘෂිකාර්මික පවුලක දළ ආදායම මාසිකව රු.25,000 දක්වා වැඩි කිරීම.
5) ජාතික සීනි අවශ්‍යතාවයට 50%ක දායක වීමක් කිරීම.
6) රුපියල් බිලියන 3ක දල ලාභයක් ලබා ගැනීම.
7) විදේශ විනිමය වශයෙන් රුපියල් බිලියන 30ක් ඉතිරි කිරීම.
8) සමගාම්ව මෙගා වොට් 75ක විදුලි බලයක් උත්පාදනය කිරීම.

777 පරමාර්ථය - දිගු කාලීන - (2019 තෙක් වසර 7කට)

1) මෙට්‍රික් ටොන් 700,000ක සීනි නිෂ්පාදනයක් සාක්ෂාත් කරගැනීම.
2) ගොවිතැනෙහි යෙදෙන පවුල් 100,000ක් නඩත්තු කිරීම.
3) සෘජු රැකියා අවස්ථා 18,000ක් සැපයීම.
4) කෘෂිකාර්මික පවුලක දළ ආදායම මාසිකව රු.35,000 දක්වා වැඩි කිරීම.
5) ස්වයංපෝෂිත වීම.
6) රුපියල් බිලියන 7ක දල ලාභයක් ලබා ගැනීම.
7) විදේශ විනිමය වශයෙන් රුපියල් බිලියන 70ක් ඉතිරි කිරීම.
8) සමගාම්ව මෙගා වොට් 200ක විදුලි බලයක් උත්පාදනය කිරීම.

උපාය මාර්ග

1) වගාකරුවා මත පදනම්වූ අප වගා ආකෘතිය.
2) වැඩි ඵලදාවක් ලබාදෙන ප්‍රභේදයන්, වඩාත් ගුණාත්මක කෘෂිකාර්මික ව්‍යවහාරය සහ කාර්යක්ෂම උපකාර සේවාවන් හරහා ඵලදායිතාවය වැඩිකිරීම. එමගින් ගොවියන්ට වැඩි ලාභයක් ලබා දීම.
3) ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ඵලදායිතාවය සඳහා දිරිගැන්වීම් ලබා දීමෙන් ගොවියන් අභිප්‍රේරණය කිරීම
4) ඵලදායිතා දිරිගැන්වීම් සහ පටිපාට හරහා නිලධාරී මණ්ඩලය අභිප්‍රේරණය කිරීම.

පර්යේෂණ සහ සංවර්ධනය

ශ්‍රී ලංකා සීනි පර්යේෂණ ආයතනය සමග උක් වගාව සහ සීනි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදුකරමින් පවතී.

සංස්ථානික ප්‍රජා වගකීම්

උක් වගාවේ යෙදෙන ගොවියන්ගේ ආදායම් අගයන් වැඩිකර, අපේ මෙහෙයුම් දියත් කරන පරිසරය සහ ප්‍රජාව තුලට අගයන් එකතු කල යුතු බව අපේ විශ්වාසයයි.



අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ පණිවුඩය



බොහෝ ප්‍රදේශවල උක් වගාවේ යෙදුනු ගොවියන්ට තම ජීවන මාර්ගය නැතිවී ගියේය. සීනි නිෂ්පාදනය දේශීය නිශ්පාදන අවශ්‍යතාවෙන් 5%ක ප්‍රමාණයකට පහත වැටුනි. මෙම පසුබිම තුල ජාතික අවශ්‍යතාවයක් ලෙස සලකා මෙවැනි ජාතික සම්පතක උෆන උපයෝජන පරතරය අවම කිරීමෙහිලා මැදිහත්වීමක් කරන්නට රජය පියවර ගත්හ. රජය පැල්වත්ත සහ සෙවනගල සීනි කර්මාන්තශාලා නැවත පණ ගන්වනු ලැබීය .

ශ්‍රී ලංකාව අමෙරිකානු ඩොලර් බිලියන 55 ක් පමණ වාර්ෂිකව සීනි ආනයනය සඳහා වියදම් කරනු ලබයි. මේ කර්මාන්තය සංවර්ධනය කිරීමෙන් විශාල විදේශ විනිමය ගලායාමක් නතරකර ගැනීමේ හැකියාවක් අපට හිමිවේ. මීට අමතරව එතනොල්, ජීව විද්‍යාත්මක ඩීසල් සහ තවත් අතුරු නිෂ්පාදන කිහිපයක් සීනි හරහා නිපැයුම් කල හැක. හෙක්ටෙයාරයක් වගා කිරීමෙන් උපයාගත හැකි ආදායම මාසිකව රුපියල් 30,000කට තක්සේරු කර ඇත.

කුඩා පරිමාණයේ වගාකරුවන් හරහා උක් වගාවේ යෙදවීමට සුදුසු හෙක්ටෙයාර 130,000ක් රජය හඳුනාගෙන ඇත.

ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිඳුන්ගේ පණිවුඩය



ශ්‍රී ලංකාව නිපදවන්නේ එහි සීනි අවශ්‍යතාවයෙන් 8%ක් පමණක් නිසාවෙන් රුපියල් බිලියන 55 ක් ඉක්මවා යන මුදලක් වාර්ෂිකව වියදම් කරමින් සීනි ආනයනය කරයි. රටක් වශයෙන් ආර්ථිකයට අහේනියක් වන මෙවැනි වියදමක් දරා ගැනීමේ හැකියාවක් නැත. මෙම ක්ෂේත්‍රයේ සංවර්ධනය කරා පෙරමුණ ගැනීම සඳහා සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම ස්ථාපිත කරන ලද්දේ මේ තත්වය පරාජය කිරීම සඳහාය.

උක් ගසේ ජල කළමනාකරණය වාසිදායක වන හෙයින් වියළි කලාපයේ හෝ වී වගාවට අවම සුදුසුකම් ඇති භූමි ප්‍රදේශවල උක් වගාව සංවර්ධනය කල හැක. වියළි කලාපයේ උක් ගස වගා කිරීම සඳහා විශාල භූමි ප්‍රමාණයක් ඇත.

උක් වගාවට ගොවියන්ට සැලකිය යුතු ආදායමක් ලබාදී අනිවාරයෙන් ඔවුන්ගේ ප්‍රජා ආර්ථික තරාතිරම උසස් මට්ටමකට පත් කරන හැක. උක් වගාවට ආහාර සුරක්ෂිත බව කරා දායක විය හැකිවන අතර උක් රෝට විදුලි බලය ප්‍රජනනය කිරීමට භාවිතා කර හැක. ශ්‍රී ලංකාවේ ජීව විද්‍යාත්මක එතනොල් නිපදවීමෙන් වියදමින් අධික පොසිල ඉන්ධනවලට උෆනපූරණයක් එකතු කල හැක. මීට අමතරව අපට ඉතිරි කර හැකි රුපියල් බිලියන 55 මගින් අප ආර්ථිකයට වාසියක් ලබාදිය හැකි වන අතර මෙම මුදල වෙනත් සංවර්ධන කටයුතු සඳහා යෙදවිය හැක. මෙම බෝගයේ විභවය ආර්ථිකය දියුණු කිරීම, විදේශ විනිමය ඉතිරි කිරීම, ජීවනෝපායන් වැඩි කිරීම, ජීව විද්‍යාත්මක එතනොල් සහ සීනි නිපදවීම යනුවෙන් පැතිකඩ කීපයකින් සමන්විතවේ.

ගරු අමාත්‍ය ලක්ෂමන් සෙනවිරත්න මැතිඳුන්ගේ පණිවුඩය



ශ්‍රී ලංකාවේ වාර්ෂික ඒක පුද්ගල සීනි පරිභෝජනය වසරකට කිලෝ ග්‍රෑම් 32 බැගින් වාර්ෂික අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් 650,000කි. 2020 වන විට සීනි අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් මිලියනයක් කරා ලඟා වනවා ඇත. ශ්‍රී ලංකාවට වාර්ෂිකව විශාල නිෂ්පාදනයක් සාක්ෂාත් කරගැනීමේ හැකියාවක් තිබෙන නුමුත් වත්මන් නිෂ්පාදනය 8% කට සීමාවී ඇත. වියලි කලාපයේ වගාවට සුදුසු ඉඩම් විශාල ප්‍රමාණයක් ඇති අතර වී වගාව සීමිත ලෙස කෙරෙන ප්‍රදේශවලද සුදුසු ඉඩම් ඇත.

අවශ්‍යතාව සහ විභවය නිසියාකාරව අවබෝධකරගෙන අති ගරුජනාධිපතිවරයා විසින් හෙක්ටෙයාර 130,000ක් උක් වගාව සඳහා වෙන්කර ඇත. මෙම ඉඩම් ගොවියන් විසින් වගා කරනු ලබන අතර ඔවුන් එමගින් ස්ථීර ආදායමක් ලබමින් ඔවුන්ගේ ජීවන රටාව ඉහල මට්ටමකට ගෙන එනවා ඇත.

උක් වගාව මගින් සීනි නිෂ්පාදනයට අමතරව විදුලි බලය, වැඩි උදසීන තත්වයක මධ්‍යසාර, ජීව විද්‍යාත්මක ඩීසල්, ප්ලාස්ටික්, පොහොර, කොම්පෝස්ට් සහ වෙනත් අතුරු නිෂ්පාදන ලබාගැනීමට විභවයක් ඇත. හෙක්ටෙයාර 130,000ක වගාවක් හරහා ග්‍රාමීය ආර්ථික සංවර්ධනය කරා පෙරමුණ ගෙන ගොවියන්ගේ ආර්ථිකයද වැඩිදියුණු කරගැනීමට හැකියාව ඇත. තවදුරට රටේ විදේශ විනිමය විශාල වශයෙන් ඉතිරි කිරීමක් කර ජාතික ආර්ථිකයට ධනාත්මක බලපෑමක් කිරීමටද හැකියාව ඇත.

ගරු අමාත්‍ය ලක්ෂ්මන් සෙනවිරත්න මැතිඳුන්ගේ පණිවුඩය

"මහින්ද චින්තනය ඉදිරි දැක්ම" පදනම් කොටගෙන දේශීය උක් කර්මාන්තය ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රබල අංශයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් යුතුව රජය විසින් ප්‍රගතිශීලී පියවර රාශියක් ගනු ලැබූ අතර ඒ තුළින් දේශීය පරිභෝජනයට අවශ්‍ය සීනි මෙ.ටො. 600,000ක් ආනයනය කිරීම සඳහා වාර්ෂිකව වැය කරන රුපියල් මිලියන 60,000ක් පමණ වන විදේශ විනිමය ප්‍රමාණයක් රට තුළ ඉතිරිකර ගැනීම ප්‍රධාන අරමුණක් විය.

ඒ වනවිටත් දේශීය කර්මාන්තශාලා වූ පැල්වත්ත, සෙවනගල, හිඟුරාන කන්තලේ යන කර්මාන්තශාලා වලින් කන්තලේ සහ හිඟුරාන කර්මාන්තශාලා අක්‍රියව පැවති අතර පැල්වත්ත, සෙවනගල කර්මාන්තශාලා දෙක පෞද්ගලික ව්‍යවසායකයින් විසින් කළමනාකරණය කරන ලදී. එම කර්මාන්තශාලා දෙකද කළමනාකාරීත්වයේ අකාර්‍යක්ෂමතාව හේතුවෙන් 2011 අංක 43 දරණ ඌණ ක්‍රියාකාරී ව්‍යවසාය හෝ ඌණ උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත යටතේ 2011-11-11 දින සිට රජයට පවරා ගන්නා ලද අතර එම ආයතන දෙක කළමනාකරණය කිරීම සඳහා රජයට පූර්ණ අයිතිය ඇති සී/ස ලංකා සීනි (පුද්) සමාගම ස්ථාපනය කරන ලදී. ඒ අනුව පැල්වත්ත හා සෙවනගල කර්මාන්තායතනයන් සතු ඉඩම් 99 අවුරුදු බදු පදනමට එම සමාගම වෙත රජය විසින් පවරා දීමට කටයුතු කරන ලදී. දස වසරක් පමණ කාලයක් වසා දමා තිබූ හිඟුරාන සීනි කර්මාන්තායතනය භාණ්ඩාගාරයට 51%ක අයිතිය ඇති 49%ක් පෞද්ගලික අංශයට අයත්වන ලෙස පිහිටුවන ලද සී/ස ගල්ඔය වැව්ලි සමාගම මඟින් 2012 වර්ෂයේ දී නිෂ්පාදන කටයුතු යලි ආරම්භ කරන ලදී.

උක් ආශ්‍රිත කර්මාන්තය ස්ථිර කර්මාන්තයක් බවට පත් කිරීමේ පරමාර්ථයෙන් යලි රජය වෙත පවරා ගන්නා ලද සෙවනගල හා පැල්වත්ත කර්මාන්තශාලා දෙකෙහි කළමනාකරණ කටයුතු 2011-11-11 සිට 2012-09-01 දක්වා කාලය තුළ දී එහි පාලන කටයුතු ද අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද නිසි බලධාරීවරයා යටතේ සිදු වූ අතර, ඒවා ඵලදායීතා ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ පාලනය විය. 2012.09.01 දින සිට භාණ්ඩාගාරයට පූර්ණ අයිතිය ඇති සී/ස ලංකා සීනි (පුද්) සමාගම පිහිටුවා එම ආයතනයේ කළමනාකාරීත්වයට පවරා දෙන ලදී.

මෙම කාලය තුළ දී සෙවනගල සීනි සමාගම රු. මිලියන 316 ලාභ ලැබීමට සමත්වී ඇත. පෞද්ගලික කළමනාකාරීත්වයේ දුර්වලතාවයන් හේතුවෙන් පැල්වත්ත සීනි සමාගම මෙම කාලය ඇතුළත පාඩු ලැබුවද 2013 වර්ෂය වනවිට 2012 වර්ෂයේ වූ මිලියන 192 ක පාඩුවද මගහරවාලමින් රු.මිලියන 784 ක ලාභයක් ලැබීමට සමත් විය.

2013 ජනවාරි 28 වන දින සිට ගැසට් නිවේදන අංක 1795/43 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය ස්ථාපිත කිරීමෙන් පසුව පැල්වත්ත හා සෙවනගල කර්මාන්තායතනයන් මෙන්ම මවු සමාගම වන සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමද එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සමාගම් බවට පත් විය. එසේම සී/ස ගල්ඔය වැව්ලි (පුද්) සමාගමේ අධීක්ෂණ කටයුතු ද මෙම නව අමාත්‍යාංශය වෙ පවරා දෙන ලදී.

පෞද්ගලික අංශයේ කළමනාකාරීත්වය යටතේ පිරිහෙමින් පැවති මෙම ආයතන මූලික පියවරක් වශයෙන් රජයට පවරාගෙන පුනරුත්ථාපනය කොට, ලාභ ලබන මට්ටමට ගෙන ඒම සඳහා කටයුතු කරන ලද අමාත්‍යාංශයේ නිලධාරීන් මෙන්ම නිසි බලධාරීවරයා ඇතුළු සී/ස ලංකා සීනි (පුද්) සමාගමේ සභාපතිවරයා, ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු සෙවනගල හා පැල්වත්ත කර්මාන්තායතන දෙකෙහි සියලුම නිලධාරීන් හටද මාගේ ගෞරව පූර්ව ස්තුතිය පුද කරමි.

ලක්ෂ්මන් සෙනවිරත්න (පාම)
සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

ලේකම්තුමාගේ පණිවිඩය

2011 වර්ෂය වන විට දේශීය උක් කර්මාන්තය ආශ්‍රිතව ක්‍රියාත්මක වූ සීනි කර්මාන්තශාලාවලින් කන්තලේ සීනි කර්මාන්තායතනය හා හිඟුරාන සීනි කර්මාන්තායතනය අක්‍රියව පැවති අතර සෙවනගල සීනි කර්මාන්තශාලාව හා පැල්වත්ත සීනි කර්මාන්තශාලාව පෞද්ගලික අංශයේ ව්‍යවසායකයින් විසින් කළමනාකරණය කරන ලදී. එම කර්මාන්තශාලා දෙකද කළමනාකරණයේ අකාර්‍යක්ෂමතාවය හේතුකොට ගෙන 2011 අංක 43 දරණ ඌණ ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌණ උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත යටතේ 2011-11-11 දින සිට රජයට පවරා ගන්නා ලදී. ඒ අනුව එම කර්මාන්තශාලා දෙක කළමනාකරණය කිරීම සඳහා රජයට පූර්ණ අයිතිය ඇති සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම ස්ථාපිත කරන ලදී. මෙම කාලය වනවිට උක් කර්මාන්තය සම්බන්ධ විෂයය අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය මෙන්ම ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය.

රජයට පවරා ගන්නා ලද සෙවනගල හා පැල්වත්ත කර්මාන්තායතනයන් පාලනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් නිසි බලධාරියෙකු පත් කරන ලද අතර එම කාලය තුළ දී කර්මාන්තායතනයන් දෙකෙහි කළමනාකරණය යලි ගොඩනැගීමට හැකි වූ අතර සෙවනගල සීනි සමාගමේ ලාභය රු. මිලියන 316 මෙන්ම පැල්වත්ත සීනි සමාගමෙහි අලාභයක් වූ රු. මිලියන 192 ප්‍රමාණය පියවා ගෙන 2013 වර්ෂය වනවිට රු. මිලියන 784 ක ලාභයක් ලබා ගැනීමට හැකිවන අයුරින් නැවත ප්‍රතිසංවිධානය කරන ලදී. මෙම වකවානුව තුළ දේශීය උක් කර්මාන්තය සම්බන්ධයෙන් නව පිබිදීමක් ඇති වූ අතර සීනි කර්මාන්ත සංවර්ධනය සඳහා වෙනම අමාත්‍යාංශයක් පිහිටුවීමට ද රජය විසින් කටයුතු කරන ලදී.

ඒ අනුව 2013 ජනවාරි මස 28 දිනැති අංක 1795/43 දරණ අති විශේෂ ගැසට් නිවේදනය අනුව "සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය" ස්ථාපිත කරන ලද අතර සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම හා ඒ යටතේ ක්‍රියාත්මක සෙවනගල හා පැල්වත්ත යන සමාගම් දෙකද අමාත්‍යාංශය යටතට පත් කරන ලදී.

පැල්වත්ත හා සෙවනගල සීනි සමාගම් 2011-11-11 සිට 2012-09-30 දක්වා කාලය තුළ නිසි බලධාරිවරයෙකු යටතට පත් කොට ක්‍රියාත්මක වූ අතර ඒ තුළින් ලබා ගන්නා ලද ප්‍රගතිය, අභිනවයෙන් පිහිටුවන ලද සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ නවදුරටත් තහවුරු කරමින් 2013 වර්ෂයේ දී පැල්වත්ත සීනි කර්මාන්තායතනය රු. මිලියන 784 ක හා සෙවනගල සීනි කර්මාන්තායතනය රු. මිලියන 607 ක් ලාභයක් ලැබීමට සමත් වී ඇත.

මේ තුළින් ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තය යලි පණගැන්වීමට හැකියාව ලැබුණු අතර නිෂ්පාදනය ඉහළ නැංවීම මෙන්ම උක් කර්මාන්තය ආශ්‍රිත ශ්‍රමික පවුල්වල ආදායම ඉහළ නැංවීමට ද හැකි විය.

මෙම වකවානුව තුළ සමාගම් දෙකෙහි කාර්යක්ෂමතාවය ඉහළ නැගීම සඳහා නායකත්වය හා මඟ පෙන්වීම ලබා දුන් ගරු අමාත්‍යතුමාට මෙන්ම මෙම කර්මාන්තායතන දෙකෙහි සේවය කළ සියලුම කාර්යමණ්ඩලයටද මාගේ ගෞරව පූර්ව ස්තුතිය පිරි නමමි.

උදය ආර්. සෙනෙවිරත්න
ලේකම්
සීනි කර්මාන්තත සංවර්ධන අමාත්‍යාංශය

මිහිරි සඵලත්වය

සඳහා සාරවත් බවින් පොහොසත් වීම



සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍යමය සහ මෙහෙයුම් ක්‍රියාදාමයන් තුල ඉස්මතුවන කරුණු - 2013

(අගයන් රුපියල් මිලියන වලින් දැක්වේ)	2013		
මූල්‍යමය ඉස්මතු කිරීම්	**පැල්වත්ත**	**සෙවනගල**	**ඒකාබද්ධ සහ ප්‍රධාන කාර්‍යාලය**
පිරිවැටුම් අගය	3,689.65	2,057.39	5,747.05
විකුණුම් පිරිවැය	(2,540.03)	(1,293.72)	(3,833.75)
දළ ලාභය	1,149.62	763.67	1,913.30
බදු ගෙවීමට සහ අනෙකුත් ආදායම් පෙර ශුද්ධ ලාභය	734.97	606.93	1,345.72
අනෙකුත් සමස්ත ආදායම්	48.68	-	48.68
බදු ගෙවීමට පෙර සහ අනෙකුත් ආදායම් වලට පසු ශුද්ධ ලාභය	783.64	606.93	1,394.39

මෙහෙයුම් කාර්‍යසාධනය	2013		
	පැල්වත්ත	**සෙවනගල**	**ඒකාබද්ධ**
ඉඩම් වගාව	13,284	4,215	17,499
ඉඩම්වගාවට සුදුසු (හෙක්ටෙයාර්)	9,188	3,311	12,499
වගාවට ලක්වුනු %	69%	79%	71%
වගා බිම් වැඩිවීම (හෙක්)2012 සමග සසඳ)	1,283	861	2,144
වගා බිම් වැඩිවීම් % (හෙක්)2012 සමග සසඳ)	16%	35%	21%

2013 අස්වනු ව්‍යාපෘතිය	**පැල්වත්ත**	**සෙවනගල**	**ඒකාබද්ධ**
ලබාගත් අස්වැන්න (මෙට්‍රික් ටොන්)	332,635	177,469	510,104
2012 වැඩිවීම් ප්‍රතිශතය	29%	48%	35%
සීනි අදාල ආපසු ලබාගැනීම	8.5%	8.0%	8.34%

සීනි නිෂ්පාදනය	**පැල්වත්ත**		**සෙවනගල**	
	2013	2012	2013	2012
මෙට්‍රික් ටොන්	28,358	22,712	14,191	9,631

මානව සම්පත්	**පැල්වත්ත**		**සෙවනගල**	
	2013	2012	2013	2012
ස්ථිර	1,283	1,353	347	265
ගිවිසුම	336		400	350
අනියම්	2,520	3,305	10	
වාරික	685			
පුහුණුලාභීන්	25	356	16	
මුළු ගණන	4,849	5,014	773	615
ඒක පුද්ගල නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)	5.85	4.53	18.36	15.66

මිහිරි සවුලත්වය

අහස සමග ගැටෙන විටක



සභාපතිවරයාගේ ප්‍රකාශය



සභාපතිවරයාගේ සමාලෝචනය

2013 දෙසැම්බර් 31 දින අවසන්වූ වසර සඳහා සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව සහ මූලමය ප්‍රකාශනය අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කිරීම පිළිබඳව මම සතුටු වෙමි.

මූල්‍යමය කාර්යසාධනය

සමාලෝචනයට ලක්වන මූල්‍යමය වසර තුලදී සමාගම රුපියල් බිලියන 1.39 ක බදු ගෙවීමට පෙර මෙහෙයුම් ලාභයක් සටහන් කලේය. මෙය සමාගම සම්පූර්ණ කල පළමුවැනි මූල්‍යමය වසර වන හෙයින් මෙම ලාභ ප්‍රතිශතය සැසඳීමකට ලක්කර නොහැක. නමුත් මෙහෙයුම් තොරතුරු අනුව කාර්ය සාධනයේ වැඩිදියුණුවක් තිබුන බව පෙනී යයි. වසර තුලදී හෙක්ටෙයාර 2144ක් වගාවට ලක්වූ අතර 2012 වසර හා සමග සැසඳූ විට 34.79%ක වැඩිවීමක් සනිටුවන් කරමින් මෙට්‍රික් ටොන් 131,662 ක උක් අස්වැන්නක් ලබා ගත්තේය. 31%ක වර්ධනයක් සනිටුවන් කරමින් සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 10,206 කින් වැඩි විය.

"මහින්ද චින්තනය යටතේ අපට වසර දෙකක් තුල අපගේ සීනි නිෂ්පාදනය දෙගුණ කර 2019 වන විට සීනි මෙට්‍රික් ටොන් 700,000 ක් නිෂ්පාදනය කරමින් සීනිවලින් ස්වයංපෝෂිත වීමට අපි බලාපොරොත්තු වෙමු."

	2012		2013		සීනි නිෂ්පාදනය වැඩි කිරීම (මෙට්‍රික් ටොන්)	සීනි නිෂ්පාදනය වැඩි කිරීම (%)
	සීනි නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)	උක් අස්වැන්න (මෙට්‍රික් ටොන්)	සීනි නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)	උක් අස්වැන්න (මෙට්‍රික් ටොන්)		
පැල්වත්ත	22,712	258,191	28,358	332,635	5,646	25%
සෙවනගල	9,631	120,251	14,191	177,469	4,560	47%
එකතුව	32,343	378,442	42,549	510,104	10,206	31%

ජයග්‍රහණ

ගොවියන්ට සහ සේවකයින්ට අදලව දිගු කාලයක් පුරා උරුම වුන ගැටළු සමාගමේ කළමනාකරණ විසින් සාර්ථකව නිරාකරණය කිරීමට හැකියාව ලැබුනු අතර සමාගම 10%ක දිරි දීමනා ගොවියන්ට සහ සේවකයින්ට ප්‍රධානය කලේය. මෙම දිරි දීමනා ප්‍රදනෝත්සවයට ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිවරයාට ඇරයුම් කිරීමට වරප්‍රසාදය හිමිවුන අතර ඔහුගේ සහභාගිත්වය තුලින් ගෞරවයක් භුක්ති විත්දේය.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ අනාගතය

අප ඉලක්කය වනුයේ 2019 වන විට ස්වයංපෝෂිත වීමය. මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සහ අනෙකුත් කොටස්කරුවන් වන ගොවියන්, සේවකයන්, කළමනාකරණ ඛණ්ඩායම සහ රජය වඩාත් කැපවීමෙන් කටයුතු කලයුතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය නිතිපතා උක් වගාව ව්‍යාප්ත කිරීමට කටයුතු කරමින් පවතී. අප දර්ශනය සාක්ෂාත් කරගැනීම සඳහා ගොවියන් දිරිමත් කිරීමත් නව ගොවියන් බඳවා ගැනීමත් අවශ්‍යවේ. අළුත් ඉඩම් අත්පත් කරගැනීම සහ අප සතු ගොවිපොලවල ඵලදායිතාවය වැඩි කිරීමත් වැදගත්වේ. මෙහෙයුමෙන් උපරිම ප්‍රයෝජනය උකහා ගැනීම පිණිස ප්‍රධාන නිෂ්පාදනයට අමතරව අපි අතුරු නිෂ්පාදන කෙරෙහිද අවධානය යොමු කෙරේ. අපි සෙවනගලදී මෙගාවොට් 10 කුත් පැල්වත්තෙහිදී මෙගාවොට් 15 ක විදුලිබලය සමගාමීව උත්පාදනය කිරීම සඳහා තක්සේරු කර ඇත. සෙවනගල උසස් මට්ටමේ කාබන්ඩයොක්සයිඩ් බෝතල් කිරීමට යන්ත්‍රෝපකරණ සහිත කර්මාන්තශාලාවක් සහ ජලය පිරියම් කිරීමේ යන්ත්‍රෝපකරණ සහිත කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘති අතර වෙයි.

අගය කිරීම

මම අධ්‍යක්ෂ මණ්ඩලයේ මගේ සගයන්ට ඔවුන්ගේ සහයෝගය නිතිපතා ලබාදීම පිළිබඳවද කළමනාකරණය සහ කාර්ය මණ්ඩලයට 2013 වසර තුල ඔවුන්ගේ දායකත්වය පිළිබඳවද කෘතඥ වෙමි. මම උක් වගාකරුවන්ටද, අප බෙදා හැරීමේ ජාලයට අනුයුක්ත ගණුදෙනුකරුවන්ටද, සීනි තොග වෙළෙන්දන්ටද, බැංකු සහ අනෙකුත් රජයේ ආයතනයන්ටද මගේ ස්තුතිය පල කරමි. සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍ය ගරු ලක්ෂමන් සෙනවිරත්න මහතාට, අමාත්‍යාංශ ලේකම්තුමා වන උදය සෙනවිරත්න මහතාටද, අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයටද මෙම කාලසීමාව තුල නිතිපතා ලබාදුන් මාර්ගෝපදේශ සහ සහයෝගයටද අවසන් වශයෙන් වූවත් කිසිම අයුරකින් වැදගත්කමින් නොඅඩු ලෙස සලකා මම ස්තුතිය ප්‍රකාශ කරමි.

කීර්ති බී. කොටගම
සභාපති
2014 මැයි 12

අධ්‍යක්ෂකවරයාගේ / ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ ප්‍රකාශය



සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම **(LSCPL)** ස්ථාපිත කිරීමත් සමග පැල්වත්ත සහ සෙවනගල සීනි කර්මාන්තශාලා අළුතින් ස්ථාපිත වුනු සමාගමේ පාලනයට නතුවුනි. සමාගමේ මූලික අරමුණ වනුයේ මෙම කර්මාන්තශාලා දෙකම පූර්ණ ධාරිතාව ඔස්සේ ක්‍රියාත්මක කිරීමෙන් ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තයතය සංවර්ධනය කර අනාගතයේදී රට සීනිවලට අදලව ස්වයංපෝෂිත කිරීමයි.

මෙම අරමුණ සාක්ෂාත් කරගැනීමෙහිලා අතිගරු ජනාධිපතිවරයා විසින් හෙක්ටෙයාර් 130,000ක් උක් වගාව සඳහා වෙන්කරනු ලැබ ඇත. **LSCPL** විසින් ඉඩම් හඳුනාගෙන ඒවා මිනිතනය කිරීමත් සීමාංකනය කිරීමත් ආරම්භ කර ඇත. අපි මේ සඳහා විදේශීය ආයෝජනය යොදවන්නට කටයුතු කරන අතර මේ වසර තුල සීනි කම්හල් කිහිපයක් අරඹන්නට පියවර ගන්නවා ඇත .

සීනි කර්මාන්තය දියුණු කිරීමෙන් රටට පමණක් නොව දිස්ත්‍රික්කයටද ග්‍රාමීය ගොවියන්ටද සෙතක් වෙනවා ඇත. පැල්වත්ත සහ සෙවනගල නිෂ්පාදනාගාර සහ යන්ත්‍රෝපකරණ යුහුසුලුව බරපතල අළුත්වැඩියා කිරීමකට නතුවිය යුතුව පවතින නිසාවෙන් එම කර්මාන්තශාලා දියුණු කිරීම අසීරු කර්තව්‍යයක් වනු ඇත. දුෂ්කරතා කිහිපයකට මුහුණදීමෙන් පසුව අපි මෙම ස්ථාන දෙකෙහි යන්ත්‍රෝපකරණ පිලිසකර කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

සෙවනගල පිලිසකර කිරීමෙන් පසුව එහි ඇඹරුම් ධාරිතාව දවසට මෙට්‍රික් ටොන් 1250 සිට 2000 දක්වා වැඩි වන අතර එහි මෙගාවොට් 10 ක විදුලි බලයක් උත්පාදනය වෙනවා ඇත. මේ අනුව ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 6 විට 8 දක්වා අපනයනය කිරීම බලාපොරොත්තුවයි. පැල්වත්තෙහිත් එම ධාරිතාවම පවත්වාගෙන යන්නට නියමිත වන අතර මෙගාවොට් 15 ක් උත්පාදනය කර මෙගාවොට් 10 සිට 12 දක්වා ජාතික පද්ධතියට අපනනය කිරීමට අරමුණුගත වේ. වඩාත් වැදගත් වනුයේ මෙම දායකවීම සිදුවනුයේ දේශගුණික තත්වයන් හේතුකොටගෙන ජාතික පද්ධතියේ උත්පාදනය අඩු මට්ටමකට පහත වැටෙන සමයකදීය.

මෙම කර්මාන්තය දියුණු කිරීමෙන් එය රටට මුදල් සපයන්නකු බවට පත්වෙනු අතර එමගින් ග්‍රාමීය ගොවීන්ගේ ප්‍රජා ආර්ථික තත්වය ඉහල නංවමින් මොනරාගල දිස්ත්‍රික්කයේ සාර්ව ආර්ථික තත්වය වැඩිදියුණු කෙරෙනු ලැබේ.

2013 වසර තුල සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම බදු සහ දිරි දීමනාවලින් තොරව 1,59 බිලියනක ලාභයක් ලබා එයින් 20%ක් වන රුපියල් මිලියන 278 ක් නිෂ්පාදන දියුණුවක් ඉලක්ක කර ගනිමින් ගොවීන් සහ කාර්ය මණ්ඩලය අතර දිරි දීමනා වශයෙන් බෙදහරින්නටත් පියවර ගත්තේය.

අප කර්තව්‍ය පහසු කිරීම පිණිස මට දුන් සහයෝගය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට මගේ ස්තුතිය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. පැල්වත්තේ සහ සෙවනගල ප්‍රධාන මෙහෙයුම් නිලධාරීන්ටද, කළමනාකරණ කාරක සභාවලටද, ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරයන්ටද, කළමනාකරුවන්ට සහ කාර්ය මණ්ඩලයේ සමාජිකයින්ටද ඉතා හොඳින් ඉටුකර ඇති කාර්යය සඳහා ස්තුති කිරීමට කැමැත්තෙමි.

ඩී.එම්.වී. පෙරේරා
අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරි
2014 මැයි 12

අවදානම් කළමනාකරණය

අවදානම් වර්ගීකරණය	විස්තර කිරීම	ක්‍රියාන්විතයේ සැලසුම
මෙහෙයුම්වලට අදාළ අවදානම්.	උක් වගාව සඳහා ඉඩම් වෙන්කිරීම.	◆ උක් රු.3200/- සිට රු.4200/- දක්වා වැඩිකිරීම. ◆ අස්වැන්න සඳහා අත්තිකාරම් සහ අනෙකුත් ද්‍රව්‍ය, ණයමත පිරිනැමීම. ◆ රජය විසින් පොහොර සහනාධාරය හඳුන්වාදීමෙන් උක් ගොවියන්ට ප්‍රයෝජනයක් අත් විය.
ණයදීමට අදාළ අවදානම්.	ගොවියන්ට ආයෝජනය සඳහා දෙන මුදල් බොල්ණය බවට පත්වීම.	ණය ආපසු ලබා ගැනීමට අදාළව කාර්ය මණ්ඩලය වෙත වැඩි වගකීමක් පැවරීම.
උද්ධමනයට අදාළ අවදානම්.	ආයෝජන සහ පොදු කාර්යය පිරිවැය වැඩිවීමෙන් ලාභය වෙත බලපෑමට ඇති අවකාශය.	අඩු නිෂ්පාදන වියදමක් සහ වැඩි ඵලදායිතාව කෙරෙහි අවධාරණය යොමු කිරීම.
වෙළඳපොලේ අවදානම්.	දේශීය සීනි වෙළෙන්දන් විසින් අඩු මිලට සීනි ආනයනය කිරීම.	ඒකකයක පොදු කාර්යය පිරිවැය අඩු කිරීම පිණිස නිෂ්පාදනය වැඩි කිරීම.
පාරිසරික අවදානම්	උක් අස්වැන්නට ඇතුන්ගෙන් හෝ දේශගුණික වෙනස්වීම් බලපාන නිසා ඵලදායිතාව අඩුවිය හැක.	සමාගමේ වියදමින් ඇතුන්ට එරෙහිව අගල් කැපීම, වැට බැඳීම සහ මිනිස් බාධක විකාස කිරීම.


ප්‍රබෝධමත් සිනාව,
මිහිරි සවිලත්වය

අප සංස්කෘතිය සහ සාරධර්ම

අපේ ගොවියන්

අපේ රජ ගොවියා වෙයි. ලංකා සීනි සමාගමේ විශ්වාසය අනුව ගොවියා අප සමාගමේ ඉතාමත් ප්‍රබල වැදගත් කොටස්කරුවෙකි. සෙවනගලට අයත් වගා ඉඩම් සීමිත ප්‍රමාණයක් පමණක් තිබීම නිසාවෙන් මෙය සෙවනගලට තීරණාත්මක සාධකයක් වෙයි. සැම ඉඩමක්ම පාහේ වගා කරන්නේ ගොවියන් විසිනි.

හෙක්ටෙයාරයක උක් වගාවකින් ලබාගත හැකි සාමාන්‍ය ආදායම රුපියල් 30,000ක් පමණ යනුවෙන් තක්සේරු කර තිබුනි. බොහෝ පලාත්වල උක් වගාවේ යෙදෙන ගොවියන්ගේ ආදායම පහල මට්ටමක පැවතුනි. එය, ගොවියන් එම කර්මාන්තයේ රඳවාගන්නට දිරිමත් කල තත්වයක් නොවීය. ආරම්භයේ පටන් ලංකා සීනි සමාගම මෙම තත්වය හඳුනාගත්තේය. සමාගම ගොවියන්ට ඔවුගේ ආදායම වැඩි කරගන්නට බොහෝ මුල්පිරීම් දියත් කලේය. වර්තමානයේදී ගොවියෙකුට මෙට්‍රික් ටොන් එකකට රුපියල් 4,200 ක් ගෙවනු ලැබේ. සමාගම පාලනය සියතට ගන්නාවිට එම මිල මෙට්‍රික් ටොන් එකකට රුපියල් 3,200 පමණක් වුයේය. එබැවින් මේ වනවිට සමාගම මෙට්‍රික් ටොන් එකකට උක් වගා ඉතිහාසයේ වැඩිම මිල ගෙවූ සංවිධානය බවට පත්වී ඇත. ගොවීන් දිරිමත් කිරීම සඳහා 2013 දී ලාභයෙන් 10%ක් ගොවීන්ට දිරි දීමනා ප්‍රධානය කිරීම සඳහා වෙන් කරන්නට සමාගම තීරණය කලේය. හෙක්ටයාරයකට වැඩි ඵලදායිතාවයක් ලබාගැනීම මත පදනම් වූ මෙම දිරි දීමනා ක්‍රියාපටිපාටිය වර්තමානයේදී ක්‍රියාත්මක වේ. මීට අමතරව සමාගම විසින් ගොවීන්ට පොහොර, වල් නාශක, උක් බීජ, තාක්ෂණික දැනුම සහ ප්‍රවාහනය සපයමින් පවතී.

අපේ ගණුදෙනුකරුවන්

අපේ ගණුදෙනුකරුවන් අපේ බලාපොරොත්තුවයි. අප ජනගහනයෙන් මිලියන 20 කට අධික මෙරටේ ජනතාව අපගේ ගණුදෙනුකරුවන් වේ. අපේ මූලික අරමුණ වනුයේ මොවුනට ගුණාත්මක ස්වභාවික සීනි සාධාරණ මිලකට සැපයීමයි. ශ්‍රී ලාංකිකයෙකුගේ සාමාන්‍ය වාර්ෂික ඒකපුද්ගල සීනි පරිභෝජනය කිලෝ ග්‍රෑම් 30 - 35 දක්වා වේ. අප නිෂ්පාදනය 6%පමණක් වන හෙයින් ඉතිරි 94% ආනයනය කිරීමට සිදුවේ. වාර්ෂිකව සීනි ආනයනය සඳහා ඩොලර් මිලියන 500ක් වියදම් වෙයි. මෙය අප ජාතික ආර්ථිකයට බරපතල සෘනාත්මක බලපෑමකි. අපේ සියළු උත්සාහයන් මගින් 2019 වන විට අප රට සීනි වලින් ස්වයංපෝෂිත වීම අපේ බලාපොරොත්තුවයි.

අප සේවකයින්

අප සේවකයින් අපේ ධනය වෙති. පක්ෂපාති අභිප්‍රේරිත සේවක පිරිසකින් තොරව කිසිම සංවිධානයකට සාර්ථක වීමේ හැකියාවක් නොමැත. ලංකා සීනි සමාගමේ වැදගත් කේන්ද්‍රයක් වනුයේ එහි මානව සම්පතයි. ඉතිහාසයේදී සීනි කර්මාන්තයේ යෙදී සිටි සේවකයින්ට ඔවුන්ගේ ජීවන රටාව තුල සේවා කොන්දේසි වලට අදලව නොයෙකුත් දුර්දසාවන්ට මුහුන පාන්නට සිදුවිය. පහල මට්ටමක මාසික වැටුප, ප්‍රසාද දීමනා, උසස් කිරීම් යනාදි නොයෙකුත් ගැටළු මෙයට ඇතුලත් විය. මේ සම්බන්ධව දැනුවත්වී සමාගම මෙම ගැටළු නිරාකරණය කිරීමට මුල්තැනක්දී කටයුතු කලේය. සෙවනගලදී සේවකයන් 200ක් කොන්ත්‍රාත් පදනමෙන් ස්ථිර සේවා පදනමට පත් කෙරිනි. වසර ගහණනාවකට අනියම් සේවකයන්ව සිටි බොහෝ දෙනෙකුට කොන්ත්‍රාත් සේවය ලබා දුනි. සැම මට්ටමක වැටුප් විෂමතා ඉවත් කිරීමට අපි සමත්වූහ. තරාතිරමට ගැලපෙන වැටුප් තලයන් හි පිහිටුවා එක් එක් තලයට ගැලපෙන සුදුසුකම් අත්කරගෙන තිබුනු අයට උසස්වීම් ලබා දුන්නේය. වසර තුලදී පැල්වත්තේ සැම සේවකයෙකුගේම වැටුප රුපියල් 2,500 කින් වැඩි කලේය. සමාගමේ බදු ගෙවීමට පෙර වසරේ ලාභයෙන් 10%ක් සේවක දිරි දීමනා සඳහා වෙන් කරන්නට කළමනාකරණය තීරණය කලේය. සැම සේවකයෙකුට සහ පවුලේ සාමාජිකයෙකුට සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හරහා ජීවිත සහ වෛද්‍යමය රක්ෂණ ආවරණයක් ලබාදුනි.

යහ පාලනය

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ වාර්ෂික විගණනය මාස තුනක් ඇතුලත සම්පූර්ණ කලේය. අපේ ව්‍යස්ථාපිත විගණනකරුවන් වන්නේ අර්නස්ට් සහ යං (වරලත් ගණකාධිකාරිවරු) වෙයි. බාහිර විගණනකරුවන්ට අමතරව පැල්වත්ත සහ සෙවනගල යන කොට්ඨාශ දෙකෙහිම සෘජුව ප්‍රධාන විධායක නිලධාරිතුමාට වාර්තා කරන අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තු ඇත. මීටත් අමතරව අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරිතුමා / සභාපතිවරයා වෙත වාර්තා කරන ස්වාධීන විගණනකරු වශයෙන් මාගමගේ සහ සමාගම පත්කරන ලදී.

සංරෝධන

බාධාවකින් තොරව අනාගතය කරා දිශානත වීම සඳහා වැදගත් ගැටළු කිහිපයක් තවමත් විසඳිය යුතුව ඇත. සමාගමට අයත් නොවන චංචල දේපල හේතුකොටගෙන පැල්වත්ත සහ සෙවනගල යන ස්ථාන දෙකෙහිම අවහිරතාවයක් ඇත. ඒවා ඉවත් කිරීමට හෝ ක්‍රියාවලියට අන්තර්ගත කිරීමට නීතිමය ක්‍රියාදමයන් අවසන් වන තුර අපි බලා සිටිමු. සෑහීමකට පත්විය හැකි ඉඩම් ප්‍රමාණයක් අත්පත්කර ගැනීම කළමනාකරණයට පාලනය කර නොහැක. මෙම අවශ්‍යතාවය ඉටුවන තුරු අපේ මධ්‍යම කාලීන සහ දිගු කාලීන සැලසුම් අත්හිටුවීමට සිදුවී ඇත. ශ්‍රී ලංකා රජය විසින් නියම කර ඇති ඉලක්ක සපුරාලීම සඳහා උපාය මාර්ග දැනටත් කළමනාකරණය විසින් සම්පාදන කර ඇත. අප ව්‍යාපෘතියට හරස්වන තවත් ගැටළුවක් වනුයේ නව අයෝජනයට මුදල් සපයාගැනීමය. බොහෝ බැංකු විසින් සැලකිය යුතු සම්පත් ප්‍රමාණයක් ඇපයක් වශයෙන් බලාපොරොත්තු වෙති. නමුත් පැල්වත්ත සහ සෙවනගල ඉඩම් සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමට අයත් නොවෙති. පැල්වත්තේ පරිගණක පද්ධතිය තුල මෙහෙයුම්වල ඉතිහාසයත් වර්තමානයත් අඩංගු තොරතුරු තැන්පත්ව ඇත. නමුත් සෙවනගල සේවක තොරතුරු සියල්ලක්ම පෙර අයිතිකරුවන් විසින් රැගෙන ගොස් ඇති හෙයින් සේවකයන්ගේ පාරිතෝෂික දීමනා, ගෙවීම්, සම්පාදන හෝ වෙනත් සේවකයින්ට සම්බන්ධ තොරතුරු අප සතුව නැත. එමනිසා සෙවනගල සීනි කර්මාන්තශාලාවේ පෙර කළමනාකරණය විසින් පවත්වාගෙන ගිය සටහන් පොත් යනාදිය ලබාගැනීමට රජය පියවර ගත යුතුව ඇත.

අභ්‍යන්තර විගණන වාර්තාව

(මුල් පිටපතේ සිංහල අනුවාදයකි)

මාගමගේ සහ සමාගම
වරලත් ගණකාධිකාරවරු
ටී.ඇස්. මාගමගේ ඒ.සී..ඒ. බී.ඇස්.සී.

අභ්‍යන්තර විගණකවරුන්ගේ වාර්තාව

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ අභ්‍යන්තර විගණකවරයන් වශයන් 2013 අගෝස්තු 5 වැනි දින අපව පත්කරන ලදී. 2013 ජනවාරි 1 දින සිට 2013 දෙසැම්බර 31 දක්වා සැම කාර්තුවක් පාසා සමාගම විසින් පාලනය කරනු ලබන ලංකා සීනි - පැල්වත්ත කොට්ඨාශයේ සහ සෙවනගල කොට්ඨාශයේ අපි විගණන කටයුතු කරගෙන ගොස් ඇත.

අභ්‍යන්තර විගණකවරයාගේ භූමිකාව

අභ්‍යන්තර විගණකවරයන්ගේ භූමිකාව වන්නේ සමාගමේ දුබලතා සහ අඩුපාඩු වාර්ථා කර සමාගමේ අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධති ශක්තිමත් කිරීමෙහිලා හොඳ ව්‍යවහාරයන් නිර්දේශ කර අධ්‍යක්ෂ මණ්ඩලයට සහය දැක්වීමය. නීතිමය සහ නියාමක කරණුවලට අවනත වීම, අභ්‍යන්තර මෙහෙයුම් පද්ධති සමාලෝචනය කිරීම, කාර්ය සාධනය විග්‍රහ කිරීම මෙයට ඇතුලත්වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අවදානය අදාල කරුණු වෙත යොමුකිරීම අරමුණු කරගෙන අපි පහත සඳහන් කරුණු වෙත යොමු වුනෙමු.

- ක්‍රියා පිළිවෙත් සහ පාලන ක්‍රම නිසියාකාරව ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම පිණිස ඒවා විගණන පද්ධතිය විසින් පරීක්ෂාවට ලක්කර අවශ්‍යවන විට නව පද්ධති හඳුන්වා දීම.
- භාණ්ඩ සහ සේවා සපයා ගැනීමේදී සාධාරණ මිලකට ගුණාත්මක බව තහවුරු කරගැනීමට නිසි ප්‍රතිසම්පාදන ක්‍රමවේද අනුගමනය කරන්නේදැයි සමාලෝචනය කිරීම.
- කොට්ඨාශ දෙක තුල කළමනාකරණ සහ චක්‍රලේඛ උපදෙස් නිසියාකරව අනුගමනය කරන්නේදැයි සමාලෝචනය කිරීම.
- ගිණුම් සහ අනෙකුත් පැකේජ ව්‍යාපාරික අවශ්‍යතාවයන් නිසියාකාරව ආවරණය කරන්නේදැයි සොයාබලා දුර්වලතා හෙළිදරව් කිරීම
- දුබලතා නිසාවෙන් සිදුවී තිබෙන අවප්‍රයෝගයන්, ප්‍රෝඩාවන් හෝ අලාභයන් වාර්ථා කිරීම.
- භාණ්ඩ ලේඛනය, සහ අනෙකුත් සම්පත් අහඹු ලෙස භෞතික සත්‍යාපනයකට ලක් කිරීම.

අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය

අභ්‍යන්තර පාලනයේ සඵලත්වය අගයකිරීම සඳහා, ව්‍යාපාරික සහ මෙහෙයුම් අංශවලට අදාල අවදානම් පාලනය කිරීම සහ අවම කිරීම සඳහා සමාගම දියත්කර ඇති පියවර සමාලෝචනය කල අතර ව්‍යවස්ථාපිත කරුණු, සමාගමේ මෙහෙයුම් සහ ගිණුම් ප්‍රතිපත්ති හා සම්බන්ධව සමාගමේ අනුකූලත්වය නිරීක්ෂණය කර වාර්ථා කිරීම ඉටු කලේය. අභ්‍යන්තර විගණක වශයෙන් අභ්‍යන්තර පාලනය තක්සේරු කිරීම සඳහා අපි කළමනාකරණය විසින් අනුගමනය කරන අවදානම් පාලන ක්‍රියාවලිය ස්වාධීනව සමාලෝචනය කිරීමෙන් මෙම සමාලෝචනය කරණකොටගෙන සැදුම්ලත් සමාගම තුල අවදානම්වලට අදාලව පවතින ආකෘතියේ විශ්ලේෂණයක් ඉදිරිත් කලේය. අපි අධ්‍යක්ෂ මණ්ඩලය සමග ඇතිකරගත් එකඟතාවය අනුව ස්වාධීන විගණන කටයුතු දියත්කර කාර්තුවකට වරක් වාර්ථා සැපයුයෙමු.

අභ්‍යන්තර විගණන වාර්ථා තුල අභ්‍යන්තර පාලනය වැඩිදියුණු කිරීමට කර ඇති නිර්දේශ සහ එහි මතුකර තිබෙන ගැටළු නිරාකරණය කිරීමෙහිලා කළමනාකරණයේ අදහස් දැක්වීම් ගැබ්වෙති. ඊලඟ කාර්තුවේ අභ්‍යන්තර විගණක වාර්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙනු නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළබඳව ප්‍රගතිය වාර්ථා කෙරින.

අභ්‍යන්තර විගණක කාර්යයන්

2013 වසර වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැපයුනු අවකාශය තුල අභ්‍යන්තර විගණක කාර්යයන් සැලසුම් කෙරිනි. ඒ අනුව කාර්තුවක් පාසා අපි අභ්‍යන්තර විගණන කටයුතු කරමින් නිරීක්ෂණය කරන ලද ගැටළු වලට නිර්දේශිත පිළියම් ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කර ඒ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්ථා කලේය. අපේ උපරිම දැනුවත්කම අනුව අප අභ්‍යන්තර විගණන කටයුතු තුලදී අපි ස්වාධීනව කටයුතු කර ඇති බව විශ්වාස කරමු.

අභ්‍යන්තර විගණනයේ සාර්ථකත්වය තක්සේරු කිරීම

ව්‍යාපාරයට සහ මෙහෙයුම්වලට අදාල අවදානම් පාලනය කර අවම කිරීම සඳහාත් මෙහෙයුම් කාර්යක්ෂම කිරීමටත් කරන ලද නිර්දේශ වැඩි ප්‍රමාණයක් කළමනාකරණයේ කැපවීම සමග සෑහීමකට පත්විය හැකි මට්ටමකට ක්‍රියාත්මක කෙරී ඇති බව අප විසින් කාර්තුවක් පාසා කෙරුනු නිරීක්ෂණ හරහා පෙනී ගියේය, නමුත් ස්ථාන දෙකෙහිම සංකලිත ඊ.ආර්.පී. පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය නිතර නිතර අප විසින් ඉස්මතු කරන ලදී.

අභ්‍යන්තර විගණන වාර්තාව

මාගමගේ සහ සමාගම

වරලත් ගණකාධිකාරවරු
ටී.ඇස්. මාගමගේ ඒ.සී..ඒ. බී.ඇස්.සී.

අවසන් නිගමනය

අපේ අභ්‍යන්තර විගණක කටයුතු සාර්ථක කරගැනීම සඳහා අවශ්‍ය සහයෝගය සැපයීම පිළිබඳව සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ කාර්ය මණ්ඩලයට කෘතඥ වෙමු.

මාගමගේ සහ සමාගම
වරලත් ගණකාධිකාරවරු
2014 මැයි 14.

මිහිරි සඵලත්වය

කරා පැහැදිලි මගක්



අධ්‍යක්ෂ මණ්ඩලය



සභාපතිවරයා
කීර්ති බණ්ඩාර කොටගම මහතා
බී.ඇස්.සී(කෘෂිකර්ම) Sp, ඇම්.බී.ඒ.
(මූදල් පාලනය සහ තාක්ෂණික කළමනාකරණය) AIT



අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරී
ඩී.එච්.වී. පෙරේරා මහතා
කෘෂිකර්ම ඩිප්ලෝමාව, බී.ඇස් .සී. (ගෞරව), ඇම්.ඇස්.සී.



අධ්‍යක්ෂ
තිසත් විජයගුණවර්ධන මහතා
නීතිඥ



අධ්‍යක්ෂ
අචන්ත අමරවීර මහතා
බී.කොම් (Sp) ගෞරව



අධ්‍යක්ෂ
හිරාන් වීපේසූරිය මහතා

අධ්‍යක්ෂක මණ්ඩලය සහ ඔවුන්ගේ තොරතුරු

අපගේ සභාපතිවරයා

ආචාර්ය කීර්ති බන්ඩාර කොටගම - බී.ඇස්.සී (කෘෂිකර්ම) Sp, ඇම්.බී.ඒ. (මූදල් පාලනය සහ තාක්ෂණික කළමනාකරණය) AIT

සභාපති කීර්ති බී. කොටගම මහතා ක්ෂේත්‍රයේ වෘතිමය විධායක නිලධාරිවරයෙකු වේ. ඔහු පළමුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට බැඳුනේ 2012 ඔක්තෝම්බර් 1 දිනයේදීය. ඔහු CIC කෘෂි ව්‍යාපාරවල කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරිවරයා වෙයි. ඔහු ශ්‍රී ලංකාවේ බී,ඇස්.සී. ගෞරව උපාධියක් ලබා ඇති අතර ඔහු තායිලන්තයේ ආසියානු තාක්ෂණික ආයතනයේ ව්‍යාපාර පරිපාලනවේදී (මූදල් සහ කළමනාකරණ තාක්ෂණ) උපාධියක්ද හිමිකරගෙන ඇත. ඔහු ශ්‍රී ලංකා සී.ඇස්.ආර්. අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාජිකයෙකු වන අතර ඔහු ජාතික ගෙවීම් කොමිසමේ සමාජිකයකුද, ගරු අධ්‍යාපන අමාත්‍යවරයාගේ මාධ්‍ය ලේකම්වරයාද, ආහාර සුරක්ෂිත බව පිළිබඳව සිසැරවීම් කාරක සභිකයෙකුද, ජාතික විද්‍යාත්මක පදනමේ තේමානුගත පර්යේෂණ වැඩසටහනේ සමාජිකයකුද, අග්‍රඝණයේ සත්කාරක හෝටල් කෘෂි සංචාර පිළිබඳව ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාර කාරක සභාවේ සමාජිකයෙකුද, උසස් තාක්ෂණික අධ්‍යාපනය සඳහා ශ්‍රී ලංකා ආයතනයේ පාලන මඩුල්ලෙහි සමාජිකයෙකුද වශයෙන් කටයුතු කරයි.

ගුණාත්මක බව සහ සේවාව සඳහා දේශීය සහ විදේශීය සංවිධාන කිහිපයක් විසින් අචාර්ය කොටගම මහතා පිළගනු ලැබී ඇති අතර ඔහුට තිළිණ කිහිපයක්ද පුදනු ලැබී ඇත,. ඉන් සමහරක් පහත දක්වමු :

- 2012 විශිෂ්ඨ ව්‍යවසායකත්වය - ආසියානු ව්‍යවසාය විසින් තිළිණ කරන ලද
- ආචාර්ය උපාධිය - ජාත්‍යාන්තර විවෘත විශ්වවිද්‍යාලය මගින් තිළිණ කරන ලද
- විද්‍යා විශාරද - ඉන්දියානු සාකල්‍ය වෛද්‍ය විද්‍යාත්මක විද්‍යාපීඨය විසින් තිළිණ කරන ලද ස්විශේෂ තිළිණය
- දේශමාන්‍ය දේශශක්ති - ශ්‍රී ලංකා ජාතික සාම සමිතිය විසින් තිළිණ කරන ලද ගෞරවනීය නාමයක්
- දේශමාමක දේශබන්දු සහ ප්‍රජා සුභසිද්ධිය - ශ්‍රී ලංකාවේ ත්‍රයිනිකායික සංඝ සභාව විසින් තිළිණ කරන ලද

ගුණාත්මක බව සහ සේවාව සඳහා දේශීය සහ විදේශීය සංවිධාන කිහිපයක් විසින් කොටගම මහතා පිළගනු ලැබී ඇති අතර ඔහුට තිළිණ කිහිපයක්ද පුදනු ලැබී ඇත. ඉන් සමහරක් පහත දක්වමු :

- ආසියානු ව්‍යවසාය (ඉන්දියා) විසින් තිළිණ කරන ලද - 2012 ආසියානු ශාන්තිකර කලාප ව්‍යවසායකත්වය තිළිණය **(APEA)**
- ආසියානු ව්‍යවසාය (ශ්‍රී ලංකා) විසින් තිළිණ කරන ලද - 2012 විශිෂ්ඨ ව්‍යවසායකත්වය තිළිණය

අපගේ අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරී

ඩී.එච්.වී. පෙරේරා මහතා - කෘෂිකර්ම ඩිප්ලෝමාව, බී.ඇස් .සී. (ගෞරව), ඇම්.ඇස්.සී.

අපේ අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරී ඩී.එච්.වී. පෙරේරා මහතා කළමනාකරණ ක්ෂේත්‍රයේ වෘතිමය විධායක නිලධාරිවරයෙකු වේ. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වසර 27කට සාමාන්‍යාධිකාරී වශයෙන් සේවය කර ඔහු සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් වගකීම බාර ගන්නට කාල සීමාවට පෙර විශ්‍රාම ගත්තේය.

ඔහු සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ වගකීම බාර ගන්නට ප්‍රථමයෙන් නිෂ්පාදන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ උපදේශක තනතුර දැරුවේය. පෙරේරා මහතා පකිස්ථානයේ ෆයිසල්බාධ් කෘෂිකර්ම විශ්ව විද්‍යාලයෙන් කෘෂිකර්ම ඩිප්ලෝමාව සහ සත්ව පාලනය බී.ඇස් .සී. (ගෞරව) උපාධියද, ඕස්ට්‍රේලියාවේ බ්‍රිස්බේන් නගරයේ කුවීන්ස්ලන්ඩ් විශ්ව විද්‍යාලයෙන් ඇම්.ඇස්.සී. උපාධියක්ද ලබාගෙන ඇත. පෙරේරා මහතා හරිත නිෂ්පාදනයට ඔහුගේ පරිණත බවත් වෘතිමය බවත් දායක කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

තිසත් විජයගුණවර්ධන මහතා - නීතිඥ

තිසත් විජයගුණවර්ධන මහතා එංගලන්තයේ රීඩිං විශ්ව විද්‍යාලයෙන් නීති විද්‍යාව පිළිබඳව ඇම්.ඇස්.සී. උපාධියක් ලබාගෙන ඇත. ඔහු සීමාසහිත වැන්සල උපදේශකවරු (පෞද්ගලික) සමාගමේ සහ ජේ.ටී.ඇස්. පවර් සමාගමේ අධ්‍යක්ෂක/උපදේශක වශයෙන් සේවය කර ඇත. ඔහු 2012 ඔක්තෝම්බර් 1 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබුවාට පසුව අදවන තෙක් එහි සේවය කරයි.

අවන්ත අමරවීර මහතා - බී.කොම් (Sp) ගෞරව

2013 අගෝස්තු මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරනු ලැබුවේය. ඔහු ජනාධිපති ලේකම් කාර්යාලයේ ව්‍යාපෘති නිලධාරියකු වශයෙන් සේවය කරයි.

හිරාන් විජේසූරිය මහතා

හිරාන් විජේසූරිය මහතා 2013 අගෝස්තු මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරනු ලැබුවේය. ඔහු පාර්ලමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මහතාගේ පෞද්ගලික ලේකම්වරයා වශයෙන් සේවය කරයි.

මිහිරි සඵලත්වයෙ

රස බෙදහැරීමේ කාලය



ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම සහ සංවිධානයේ ව්‍යුහය



සභාපතිවරයා
ආචාර්ය සිරිති බණ්ඩාර කොටගම



අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරි
ඩී.එච්.වී. පෙරේරා මහතා



ප්‍රධාන මෙහෙයුම් නිලධාරි
(පැල්වත්ත)
ඩී.ඇල්.ඩී. ජයන්ත මහතා



ප්‍රධාන මෙහෙයුම් නිලධාරි
(හෙවනගල)
අමුණුගම මහතා



සාමාන්‍යාධිකාරි - උත්පාදන
ඩබ්ලිව්.ඇම්. කරුණාරත්න මහතා



සාමාන්‍යාධිකාරි - මුදල්
ඇන්.එම්. නවරත්න මහතා



සාමාන්‍යාධිකාරි
- මානව සම්පත් / නිරීක්ෂණ
ඇම්. ජයකොඩි මහතා

සංවිධානයේ ව්‍යුහය - පැල්වත්ත



පැල්වත්ත කළමනාකරණ කණ්ඩායම



ඉදිරි පෙළ වමේ සිට දකුණට

ඇම්.ආර්.ඇන්. සඳරුවනි මහත්මිය (වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල්), ඩී.ඇන්. දයාරත්න මහතා (වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - කර්මාන්තශාලා), ඇම්.ඇම්.ඩී.ඇස්.ඇන්. පෙරේරා මහතා (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කෘෂිකර්ම), ඩී.ඇල්.ඩී. ජයන්ත මහතා (ප්‍රධාන මෙහෙයුම් නිලධාරී), ඩී.ඒ. .ඇන්. ඉලංගකෝන් මහතා (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මෙහෙයුම්), ලීලී ඇම්. හෙට්ටිආරච්චි මෙනවිය (සංස්ථානික තොරතුරු විධායක නිලධාරී)

පසු පෙළ වමේ සිට දකුණට

ඇම්.ඒ. කොටගහකුඹුර මහත්මිය (කළමනාකරණ ගණකාධිකාරී), ඇල්.ඒ.සී. ප්‍රසන්න මහතා (වැඩබලන කළමනාකරු),අනුර වීජේසිංහ මහතා (කළමනාකරු - මිලදී ගැනීම්), ඒ.පී. සුරංග මහතා (කර්මාන්තශාලා කළමනාකරු), මහින්ද ඩී සිල්වා මහතා (සහකාර වතුයාය ආරක්ෂාව පිළිබඳ කළමනාකරු), ඇස්. වීරසේකර මහතා (ගොල්ෆ් සහ හෝටල් සංකීර්ණ කළමනාකරු), ඇන්. වීමලසේන මහතා (ප්‍රධාන විමර්ශණ නිලධාරී), කේ.ඩී. වීතිරසිංහ මහතා (අස්වැන්න සහ මිලදී ගැනීම පිළිබඳ කළමනාකරු), එච්.ඇම්.ඒ.අයි.කේ. කටුගහ මහතා (නිෂ්පාදන කළමනාකරු), ඩී.ඒ. චන්ද්‍රරාජ මහතා (විදුලිබල ඉංජිනේරු), ආර්.ඇම්.පේ. බණ්ඩාර මහතා (නිෂ්පාදන කළමනාකරු - ඉස්කාගාරය), ඒ. මැසාවිච් මහතා (අභ්‍යන්තර විගණක), ඩබ්ලිව්.ඇස්.කේ. රත්නායක (ඉඩම් සංවර්ධන කළමනාකරු), ආර්.ඒ.ඇම්. චන්ද්‍රසිරි මහතා (කණිෂ්ඨ ශස්‍ය විද්‍යාඥ), ඩී.ඇම්.ඇස්. බණ්ඩාර මහතා (වගා කළමනාකරු), කේ.ඒ.පී.ඇස්. ස්ලිස්වත් මහතා (ඉංජිනේරු කළමනාකරු - කර්මාන්තශාලාව), ඇම්.ඩී. චන්දන මහතා (කෘෂි වැඩපොළ ඉංජිනේරු), අරුනි ගමගේ මහත්මිය (නීති නිලධාරිනී).

සංවිධානයේ ව්‍යුහය - සෙවනගල



V = ඇබෑර්තුවක් ඇත.

සෙවනගල කළමනාකරණ කණ්ඩායම



ඉදිරි පෙළ වමේ සිට දකුණට

ඇන්.ඒ. විමලරත්න මහතා (වැඩබලන යන්ත්‍රෝපකරණ කළමනාකරු), ජේ.ආර්. මාලගොඩ මහතා (සහකාර සාමාන්‍යාධිකාරී - සිවිල් ඉංජිනේරු සේවා), ඩී.කේ.ඩබ්ලිව්.ඩී සිල්වා මහතා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - කර්මාන්තශාලාව), සී.ඊ. අමුණුගම මහතා (ප්‍රධාන මෙහෙයුම් නිලධාරී), කේ.ඒ. වොල්ට (සාමාන්‍යාධිකාරී), එච්.ඇම්.ඇස්. සමරවීර (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-කෘෂිකර්ම), ඇස්.වී.ඩී. ප්‍රියන්ත (ප්‍රධාන ඉංජිනේරු)

පසු පෙළ වමේ සිට දකුණට

ඇස්.ඩබ්ලිව්. කොඩිතුවක්කු (කළමනාකරු කෘෂිකර්ම දිගුව), පී.ඒ.කේ. නන්දවැව මහතා (කළමනාකරු කෘෂිකර්ම දිගුව), ඇම්. උපුල් කුමාර මහතා (කළමනාකරු කෘෂිකර්ම දිගුව), අතුල සිරිදේව මහතා (කළමනාකරු කෘෂිකර්ම දිගුව), ඩී.සී. හෙට්ටිආරච්චි මහතා (ප්‍රධාන ඉංජිනේරු - බලශක්තිය සහ වැඩපොළ), ජයන්ත ෆර්නැන්ඩො මහතා (ජෙයෂ්ඨ කළමනාකරු - මානව සම්පත්), සපුමල් පිත්තේගෙදර මහතා (කළමනාකරු - උත්පාදන සහ අලෙවිකරණය), ඇම්. ශාන්ත විරසිරි මහතා (අභ්‍යන්තර විගණක/විමර්ෂණකරු), කිංස්ලි පතිරණ මහතා (ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරිවරයා)

සංස්ථානික ප්‍රජා වගකීම්

ප්‍රජාමූලික වගකීම් ඉටුකිම





අතිගරු ජනාධිපතිතුමාගේ උපන් දිනය සහ ඔහු දෙවැනි වරට ජනාධිපති ධූරය දැරීමේ තුන්වැනි සංවත්සරය සැමරීම සඳහා පැල්වත්ත සහ සෙවනගල සීනි කර්මාන්තශාලා කාර්ය මණ්ඩලය ප්‍රජා මූලික වගකීම් ඉටු කරමින් පලාතේ පාඨශාලා සහ ආරෝග්‍යශාලා පිළිසකර කිරීමෙහි යෙදුනේය.



අධ්‍යාපනයට අතදීමක්.....

විශ්ව විද්‍යාලයට ප්‍රවිශ්ට වීමට වරම්ලත් සේවකයින්ගේ සහ ගොවීන්ගේ දරුවන් හට රුපියල් 10,000ක ශිෂ්‍යත්වය 2014 ජනවාරි 06 වැනි දින සෙවනගල ප්‍රේක්ෂකාගාරයේදී ප්‍රධානය කෙරිනි. මෙම වැඩසටහන නිමිත්තෙන් සේවකයන්ගේ සහ ගොවීන්ගේ දරුවන් 26 දෙනෙකුට ශිෂ්‍යත්වයන් පරිනමනු ලැබීය.




දක්ෂතම උක් ගොවි මහතුන් සඳහා දේශීය සහ විදේශීය සංචාර....

ජයග්‍රාහක උක් ගොවීන් 10 දෙනකු සඳහා සෙවනගල ආයතනය ඉන්දියානු සංචාර ලබා දුන් අතර, පැල්වත්ත ආයතනය හොඳම උක් ගොවීන් 10 දෙනකු සඳහා ඉන්දියානු සංචාරයක් මෙන්ම 30 දෙනකු සඳහා දේශීය සංචාරයන්ද ලබා දෙන ලදී.



"දිවි නැගුම" ගෙවතු වගා තර ය - 2013

ස්වයංපෝෂී ජීවන ක්‍රමයකට සමාජය කේන්ද්‍ර කරමින්, වස විසෙන් තොර නැවුම් අස්වැන්නක් උදෙසා අරඹන ලද "දිවි නැගුම" ගෙවතු වගා තරඟය 2013, තරඟ ජයග්‍රාහකයින් උදෙසා මුදල්, සම්මාන සහ සහතික පත්‍ර ප්‍රදානය පසුගිය ජනවාරි මස 06 වන දින උත්සවශ්‍රීයෙන් සෙවනගල කර්මාන්ත පරිශ්‍රය ආශ්‍රිතව පවත්වන ලදී.



දහම් දැනුමෙන් පිරී සමාජයක්....

දහම් දැනුමෙන් පිරී සමාජයක් මූලිකා කර, සමස්ත සේවක මඩුල්ල උදෙසා කාලීන "දම් දෙසුමක්" පසුගිය මාර්තු මස 08 වන දින පැල්වත්ත ආයතනයේදී පවත්වන ලදී.

ස්වාධීන විගණකවරයාගේ වාර්තාව

(මුල් පිටපතේ සිංහල අනුවාදයකි)

MPDC/RD/SDS/EBO
සීමාසහිත ලංකා සීනි (ප්‍රෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත
ස්වාධීන විගණකවරයාගේ වාර්තාව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වාර්තාව

මෙහි අමුණා ඇති 2013 දෙසැම්බර් 31 දක්වා සීමාසහිත ලංකා සීනි (ප්‍රෞද්ගලික) සමාගමේ මූල්‍යමය තත්වය පිළිඹිඹු කරන මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කෙරුනි. මෙය දෙසැම්බර් 31 න් අවසන් වන වසරට අදාල සමස්ත ආදායම්, ස්කන්ධයෙහි වෙනස්වීම්, මුදල් සංසරණයන්, වැදගත් ගණකාධිකරණ ප්‍රතිපත්තිවල සංක්ෂිප්තයක් සමග වෙනත් විස්තරාත්මක සටහන් වලින් සමන්විත වෙයි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳව කළමනාකරණයේ වගකීම

ශ්‍රී ලංකාවේ ගණකාධිකරණ ප්‍රමිතීන්වලට අනුකූලව මූලය ප්‍රකාශන පිලියෙල කර සාධාරණව ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීමකි. මූල්‍යමය ප්‍රකාශන පිලියෙල කිරීමෙහිදී එය වැරදීමකින් හෝ වාංචනික චේතනාවකින් සටහන්වන දෝෂසහගත කරුණු වලින් තොරවීම සඳහා අභ්‍යන්තර පාලන ව්‍යුහයක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම, සුදුසු ගණකාධිකරන ප්‍රතිපත්ති තෝරා පිළිපැදීම, පරිධිය අනුව සාධාරණ ගණකාධිකරණ තක්සේරුවන්හි යෙදීම මෙම වගකීමට අන්තර්ගත වෙයි.

විගණනයේ අවකාශය සහ පරිශ්‍රාප්ත අදහස් දැක්වීම් පදනම.

මෙම මූල්‍යමය ප්‍රකාශන පිළිබඳව අප විගණනය මත පදනම්වූ අදහස් දැක්වීමක් ඉදිරිපත් කිරීම් අප වගකීමයි. අපේ විගණනය ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් අනුව සිදුවේ. එම ප්‍රමිතීන් අනුව මෙම මූල්‍යමය ප්‍රකාශන මුර්ත දෝෂවලින් තොර බවට අපි සහතික කරයුතු වේ. පැල්වත්ත සහ සීනි කර්මාන්ත පී ඇල් සී සහ සීමාසහිත සෙවනගල සීනි කර්මාන්ත නැමැති සමාගම් අඩු කාර්ය සාධනීය තත්වයක පවතින හෝ සම්පත් අඩු ප්‍රයෝජනයට ලක්වී ඇති ව්‍යවසායන් පුනුරුජ්ථාපනය කිරීමට පැනවූ 2011, 48 වැනි පනත යටතේ රාජසන්තක කලායින් පසුව ඒවායේ කළමනාකරණය බාරගත් අනුප්‍රාප්තිකයින් සීමාසහිත ලංකා සීනි (ප්‍රෞද්ගලික) සමාගම වේ. රාජ සන්තක කිරීමේ ක්‍රියාවලිය තුල මෙම සමාගම් සතු ඉඩම් සහ අනෙකුත් නිශ්චල දේපල ශ්‍රී ලංකා රජය නියෝජනය කල නිසි බලධාරීන් වන අනුපිලිවලින් පැල්වත්ත සීනි කර්මාන්ත සහ සෙවනගල සීනි කර්මාන්ත වෙත පැවරුනු අතර, පසුව 2012 ඔක්තෝම්බර් 01 දින නිසි බලධාරීන්ට අයත්ව තිබූ සියළු සම්පත් සීමාසහිත ලංකා සීනි (ප්‍රෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරිනි. මීට අමතරව නිසි බලධාරීන් විසින් නොසලකා හැර තිබූ දේපල කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරනු ලැබිය. වර්තමානයේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සියළු මෙහෙයුම් දියත් කිරීමේ වගකීම පැවරී ඇත.

දේපල සන්තක කිරීමේ දිනයේදී අදාල අගයන් තහවුරු කිරීම පිණිස ප්‍රත්‍යක්ෂ නොවන හේතූන් මත භෞතිකව සන්තක කරන ලද දේපල පිළිබඳ නිසි ලේඛන ඉදිරිපත් නොවුනි. නිසි බලධාරීන් එම තක්සේරු කිරීම සඳහා සහයෝගතා පදනමක් මත ලේඛන ලබා ගැනීමට හැකි අවස්ථාවන්හිදී උත්සාහයක යෙදිනි. මේවායින් සමහරක් හැකි අවස්ථාවන්හිදී විගණනය සඳහා සාක්ෂි වශයෙන් වලංගු බවට පිළිගන්නා ලදී. මූලික ශේෂයන්ට අදාල නිරවද්‍යතාවයන් පදනම් වූයේ කළමනාකරණය විසින් කරන ලද නියෝජනයන් සහ අර්නස්ට් යං වෙත නිසි බලධාරියා විසින් අනාවරණය කරන ලද සහයෝගතා පදනම මත ඉදිරිපත් කෙරුනු විගණනය සාක්ෂ්‍යයන් මතය. ඒ කෙසේ වෙතත් මෙම අදහස් දැක්වීම "අ" සිට "ආ" චේදයන් මගින් සන්තක කිරීම පිළිබඳව උපුටා දැක්වෙන කරුණු මත පදනම් වන හෙයින් ඒ බව සැලකිලිමත් විය යුතුවේ.

මූල්‍යමය ප්‍රකාශනයෙන් අනාවරණය කරන අගයන් සහ කරුණු තහවුරු කරන සාක්ෂ්‍යයන් පරීක්ෂණාත්මක ප්‍රවේශයකින් සලකා බැලීම විගණනයකට ඇතුලත් වේ. භාවිතා කරන ලද ගණකාධිකරණ ප්‍රතිපත්ති, කළමනාකරණය විසින් කරන ලද වැදගත් තක්සේරුවන්, සහ මූලමය ප්‍රකාශනය ඉදිරිපත් කිරීමට භාවිතා කරන ලද සමස්ත පිලිවෙල ඇගයීම විගණනයක අන්තර්ගතවේ.

අපේ උපරිම වැටහීම අනුව මෙම විගණනයට අවශ්‍ය වන සැම තොරතුරක්ම සහ පැහැදිලි කිරීමක්ම අපි ලබාගෙන ඇත. එම නිසා අප විශ්වාසය අනුව අපේ නිගමනය සඳහා විගණනය සාධාරණ පදනමක් වී ඇත.

(අ) අඩු කාර්ය සාධනීය තත්වයක පවතින හෝ සම්පත් අඩු ප්‍රයෝජනයට ලක්වී ඇති ව්‍යවසායන් පුනුරුජ්ථාපනය කිරීම සඳහා පැනවූ 2011 අංක 543 දරණ පනත ක්‍රියාත්මක කිරීමත් සමග පැල්වත්තේ සහ සෙවනගල පරිශ්‍රයන් තුල පැවතුනු නිශ්චල වත්කම් සියල්ලක්ම සමාගම විසින් පවරාගෙන ඇත. නමුත් මෙම පවරාගෙන ඇති වත්කම්වලට අදාල සාධාරණ අගයන් තක්සේරු කිරීමට සමාගම උත්සහකර නොමැත. එනිසා ශේෂපත්‍රයේ රජයේ ප්‍රතිපාදන වශයෙන් සඳහන් වන රුපියල් 3,554,855,177/- සාධාරණ අගයක් පිළිඹිඹු නොකරන අතර අපට මෙය තහවුරු කිරීම සඳහා විකල්ප විගණන සාක්ෂ්‍යය ලබාගැනීමට නොහැකි විය. 2011 නොවැම්බර් 11 දක්වා, පූර්ව හිමිකරුවන්ගෙන් පවරාගෙන ඇති ස්ථිර වත්කම් ලියාපදිංචිකර තබා ගැනීමේ ලේඛනයක් සමාගම සකසා නොමැත. එමනිසා එක් එක් වත්කමක අගය සහ එහි ප්‍රයෝජනවත් ආයුකාලය මූල්‍යමය ප්‍රකාශන සඳහා තක්සේරු කලයුතුවේ.

පැල්වත්ත කොට්ඨාශය ඉහත ක්‍රියාදමය අනුගමනය නොකර පූර්ව හිමිකරුවන්ගේ ලේඛනවල සඳහන් නිශ්චල සහ චංචල වත්කම්වලට අදාල ගිණුම් ශේෂයන් තම ලේඛනවලට අඩංගුකර ඇත. ඒවායේ ක්ෂය ප්‍රමාණය ඒ අනුව ගණනය කර ඇත. සෙවනගල කොට්ඨාශය, ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, භාණ්ඩ ලේඛන ශේෂ, විශ්‍රාම ප්‍රතිලාභ, දේපල ක්ෂය වීම සහ විලම්භිත බදු වත්කම්/බැරකම් ඇතුළු වත්කම්/බැරකම් පූර්ව හිමිකරුවන්ගෙන් පවරා ගැනීම ගණනය කර නොමැත.

එමනිසා සඳහන් කර ඇති වත්කම් අගයන්, ක්ෂය වීමේ ප්‍රමාණයන්/ආදයම් ප්‍රකාශනයට අඩංගු කර තිබෙන ක්ෂය වීමේ වියදම් සහ මීට සම්බන්ධ පැල්වත්ත කොට්ඨාශය 2013 දෙසැම්බර් 31 වන තෙක් දක්වා ඇති විලම්භිත බදු වත්කම්/බැරකම් තහවුරු කිරීමට සැහෙන විගණන සාක්ෂ්‍යය අපට ලබාගත නොහැකි විය. තවද ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, ආරම්භක භාණ්ඩ ලේඛන ශේෂ, විශ්‍රාම ප්‍රතිලාභ, ක්ෂය වීමේ ප්‍රමාණයන්, විලම්භිත බදු වත්කම්/බැරකම් අදාලව සෙවනගල කොට්ඨාශය දක්වා ඇති කරුණුවල පූර්ණත්වය තහවුරු කිරීමට සැහෙන විගණන සාක්ෂ්‍යය ලබා ගත නොහැකි විය.

(අා) අඩු කාර්ය සාධනීය තත්වයක පවතින හෝ සම්පත් අඩු ප්‍රයෝජනයට ලක්වී ඇති ව්‍යවසායන් පුනුරුජ්ථාපනය කිරීම සඳහා පැනවූ 2011 අංක 543 දරන පනත මගින් පූර්ව හිමිකරුවන්ට /කොටස්කරුවන්ට වන්දි ගෙවීම යනාදි කාරණා සඳහා වත්කම් /බැරකම් තක්සේරු කිරීම පිණිස පරිෂදයක් පත්කිරීමට, අදාල අමාත්‍යවරුන් බලාත්මක කර ඇත. සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමෙන් ස්වාධීනව ක්‍රියාත්මක වන මෙම පරිෂදය, පවරා ගැනීමට අදාල හිමිකම් පෑමකින් මතුවන බැරකමක් පියවන්නට ක්‍රියා කරනවා ඇත. පනතේ අඩංගු ප්‍රතිපාදන වලට අමතරව මෙම මූල්‍යමය ප්‍රකාශන තුල පවරා ගැනීම හරහා මතුවිය හැකි හිමිකම්පෑමක් නිසාවෙන් ඇතිවන බැරකමක් තක්සේරු කිරීමට ක්‍රියාමාර්ගයක් නොමැත.

නිගමනය

අ-අා ලුහුඬු සටහන්වල සඳහන් කරුණු සහ ඒවායින් මෙම මූල්‍යමය ප්‍රකාශනය වෙත සිදුවන බලපෑමට අමතරව අපේ විමර්ෂණයෙන් හෙලිවූ පරිදි සමාගම 2013 දෙසැම්බර් 31 අවසන්වූ වසර වෙනුවෙන් නිසි ගිණුම් සටහන් පවත්වාගෙන කටයුතු කර ඇති බවත් මෙම මූල්‍යමය ප්‍රකාශනය හරහා සමාගමේ තත්වය, එහි ක්‍රියා සාධනය සහ මුදල් සංසරණය පිළිබඳව ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්වලට අනුකූලව සත්‍ය සාධාරණ පිළිබිඹුවක් කිරීමට සමත්වී ඇති බවත් අපි නිගමනය කරමු.

අනෙකුත් නීතිමය සහ නියාමක අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 7 දරණ සමාගම් පනතේ 151(2) වගන්තියේ ප්‍රතිපාදන වලට මෙම මූල්‍යමය ප්‍රකාශනය අනුකූලවන බවට අපි නිගමනය කරමු

2014 අප්‍රේල් 4
කොළඹ.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

සමස්ථ ආදායම් ප්‍රකාශනය

2013 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

	සටහන්	2013 රුපියල්	31.12.2012 අවසන් වන මාස තුන රුපියල්
ආදායම	4	5,747,048,373	1,474,174,439
විකුණුම් පිරිවැය		(3,833,756,677)	(1,529,985,269)
දළ ලාභය/අලාභය		1,913,291,696	(55,810,830)
අමතර ආදායම් සහ ප්‍රතිලාභ	5	53,278,760	18,061,501
පරිපාලනික වියදම්		(724,583,331)	(136,376,821)
මූල්‍ය වියදම	6.1	(32,313,316)	(1,219,246)
මූල්‍ය ආදායම	6.2	136,043,131	20,559,857
බදු ගෙවීමට පෙර ලාභය	7	1,345,716,941	(154,785,540)
ආදායම් බදු (වියදම්)/ප්‍රතිගමනය	8	(528,888,640)	-
වාර්ෂික ලාභය		816,828,301	(154,785,540)
බදු අඩුකල පසු මෙම කාල සීමාව තුල සමස්ත අමතර ආදායම		48,678,394	(19,538,278)
බදු අඩුකල පසු මෙම කාල සීමාව තුල සමස්ත ආදායම		865,506,695	(174,323,818)
කොටසක ඉපැයුම් - මූලික	9	8,655,067	(1,743,238)

32 වැනි පිටුවේ සිට 52 වැනි පිටුව දක්වා සඳහන් වන ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍යමය ප්‍රකාශනවල අන්තර්ගතයට අයත් වෙති.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍යමය තත්ව ප්‍රකාශනය

2013 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

වත්කම්	සටහන්	2013 රුපියල්	2012 රුපියල්
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	10	2,183,552,013	2,125,531,634
විලම්බිත බදු වත්කම්	8	1,442,469	-
		2,184,994,482	2,125,531,634
ජංගම වත්කම්			
භාණ්ඩ තොග	11	1,664,308,155	905,876,284
ජීව විද්‍යාත්මක වත්කම්	12	416,610,125	364,361,161
වෙළඳ සහ වෙනත් අය විය යුත්තන්	13	58,635,978	48,988,026
අතිකාරම් සහ පූර්ව ගෙවීම්		129,350,987	78,432,222
ගොවියන්ගෙන් අයවිය යුතු ණය	14	764,202,986	533,472,015
ආයෝජන	15	1,568,902,957	744,520,039
මුදල් සහ ඊට සමකල හැකි මෙවලම්	21	58,983,083	22,235,492
		4,660,994,271	2,697,885,240
මුලු වත්කම්		6,845,988,753	4,823,416,874
ස්කන්ධය සහ බැරකම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	16	1,000	1,000
රජයෙන් ප්‍රධාන	17	3,554,855,177	3,579,880,177
සමුච්චිත ලාභ		1,095,710,269	230,203,574
මුලු ස්කන්ධය		4,650,566,446	3,810,084,751
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැරකම්	19	396,335,846	393,418,893
පොලි සහිත ණය සහ ණයට ගැනීම්	18	43,713,223	52,268,573
		440,049,069	445,687,466
ජංගම බැරකම්			
පොලි සහිත ණය සහ ණයට ගැනීම්	18	64,855,479	81,426,676
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුත්තන්	20	1,181,460,446	486,217,980
ගෙවිය යුතු ආදායම් බදු		509,057,313	-
		1,755,373,238	567,644,657
මුලු ස්කන්ධය සහ බැරකම්		6,845,988,753	4,823,416,874

.....
සාමාන්‍යාධිකාරි - මූල්‍ය

මෙම මූල්‍යමය ප්‍රකාශන සැකසීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන තබන ලද්දේ :

.....
අධ්‍යක්ෂක

.....
අධ්‍යක්ෂක

32 වැනි පිටුවේ සිට 52 වැනි පිටුව දක්වා සඳහන් වන ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍යමය ප්‍රකාශනවල අන්තර්ගතයට අයත් වෙති.

04 අප්‍රේල් 2014
කොළඹ

(මුල් පිටපතේ සිංහල අනුවාදයකි)

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය

2013 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

	ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල්	රජයේ ප්‍රධානය රුපියල්	එකතුවුනු ලාභයන් රුපියල්	මුළු ගණන රුපියල්
2012 ඔක්තෝම්බර් 01 දී	-	3,454,181,666	404,527,392	3,858,709,058
අත් පිට මුදලින් ගෙවනු නොලැබූ සාමාන්‍ය කොටස් නිකුත් කිරීම	1,000	(1,000)	-	-
කාල සීමාවට ප්‍රදානයවූ ප්‍රමාණය	-	111,110,422	-	111,110,422
ණයකරුවන්ගේ ප්‍රතිචාරය අනුව ගැලපීම		14,589,089	-	14,589,089
කාල සීමාව තුල අලාභය	-	-	(154,785,540)	(154,785,540)
අනෙකුත් සමස්ථ ආදයම්			(19,538,278)	(19,538,278)
සමස්ත ආදයම් එකතුව	-	-	(174,323,818)	(174,323,818)
2012 දෙසැම්බර් 31 දී	1,000	3,579,880,177	230,203,574	3,810,084,751
රජයේ ප්‍රදානය ආපසු ගෙවීම	-	(25,000,000)	-	(25,000,000)
පූර්ව හිමිකරු වෙනුවෙන් සමාගම විසින් ගෙවීම්	-	(25,000)	-	(25,000)
කාලසීමාව සඳහා ලාභය	-	-	816,828,301	816,828,301
අනෙකුත් සමස්ථ ආදයම්			48,678,394	48,678,394
සමස්ත ආදයම් එකතුව	-	-	865,506,695	865,506,695
සමස්ත ආදයම් එකතුව	-	-	865,506,695	865,506,695
2013 දෙසැම්බර් 31 දී	1,000	3,554,855,177	1,095,710,269	4,650,566,446

32 වැනි පිටුවේ සිට 52 වැනි පිටුව දක්වා සඳහන් වන ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍යමය ප්‍රකාශනවල අන්තර්ගතයට අයත් වෙති.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මුදල් සංසරණ ප්‍රකාශනය

2013 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

මෙහෙයුම් ක්‍රියාවලිය තුල (භාවිතයේ යෙදෙන) / පිටවෙන මුදල් සංසරණ	සටහන්	2013 රුපියල්	2012 රුපියල්
බදු ගෙවීමට පෙර අලාභ		1,345,716,941	(154,785,540)
ගැලපුම්:			
ක්ෂය වීම්	10	200,080,374	46,752,626
දේපල, පිරියත හා උපකරණ		12,325,714	-
මූල්‍ය ආදායම		(136,043,131)	(20,559,857)
මූල්‍ය වියදම		32,313,316	1,219,246
විශ්‍රාම ප්‍රතිලාභ අදල බැරකම්		77,094,525	10,772,201
ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් අලාභ		1,531,487,738	(116,601,324)
තොග (වැඩිවීම)/අඩුවීම		(810,680,834)	1,037,118,700
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ වැඩිවීම්		(60,566,717)	(34,434,947)
ගොවීන්ගෙන් හිඟ ණය අඩුවීම		(230,730,971)	(152,661,487)
වෙළඳ සහ අනෙකුත් ගෙවීම් වැඩිවීම/අඩුවීම		727,555,782	(306,238,337)
මෙහෙයුම් වලින් ශුද්ධ අත්පිට මුදල		1,157,064,997	427,182,605
ගෙවන ලද ආදායම් බදු		(21,273,794)	-
ගෙවන ලද විශ්‍රාම ප්‍රතිලාභ බැරකම්		(25,499,179)	(8,105,331)
මෙහෙයුම්වලට යොදවා ඇති ශුද්ධ මුදල		1,110,292,024	419,077,274
ආයෝජන කටයුතු සඳහා භාවිතාවන මුදල් සංසරණය			
දේපල, පිරියත හා උපකරණ අත්පත්කර ගැනීමට	10	(263,126,468)	(27,604,876)
ස්ථිර තැන්පත් සඳහා ආයෝජන අඩුවීම/වැඩිවීම		(824,382,918)	(542,845,529)
මූල්‍ය ආදායම		136,043,131	20,559,857
ආයෝජන ක්‍රියාකාරකම් තුල මුදල් සංසරණය		(951,466,254)	(549,890,548)
ණයදීමේ ක්‍රියාවලිය තුල (භාවිතයේ යෙදෙන) / පිටවෙන මුදල් සංසරණ			
ලබාගත් ණය		(32,313,316)	58,203,000
ගෙවන ලද ණය		(9,671,298)	-
පූර්ව හිමිකරු වෙනුවෙන් කරන ලද ගෙවීම්		(25,000)	(160,435)
රජයේ ප්‍රධානය ආපසු ගෙවීම		(25,000,000)	-
බදු ණය එකඟතාවය යටතේ ප්‍රාග්ධනය ආපසු ගෙවීම		(1,914,878)	-
ගෙවන ලද පොලිය		(32,313,316)	(1,219,246)
ණය සැපයමේ ක්‍රියාවලිය තුල (භාවිතයේ යෙදෙන) / පිටවෙන ශුද්ධ මුදල් සංසරණ		(101,237,808)	56,823,319
මුදල් සහ ඊට සමාන මෙවලම් ශුද්ධ වැඩිවීම/අඩුවීම		57,587,962	(73,989,954)
මුදල් සහ ඊට සමාන මෙවලම් වසර ආරම්භයේදී	21	(53,256,758)	20,733,197
මුදල් සහ ඊට සමාන මෙවලම් වසර අගදී	21	4,331,205	(53,256,758)

32 වැනි පිටුවේ සිට 52 වැනි පිටුව දක්වා සඳහන් වන ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍යමය ප්‍රකාශනවල අන්තර්ගතයට අයත් වෙති.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍යමය ප්‍රකාශනවලට අදාල සටහන්

2013 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

1. සංස්ථානික තොරතුරු

1.1 සාමාන්‍ය

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම ශ්‍රී ලංකාවේ නීත්‍යානුගතව සංස්ථාපිත කරන ලද්දකි. මෙය රාජසන්තක කල පසුව සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි අංක 27, මෙල්බෝර්න් ඇවනිව්, කොළඹ 04හි ලියාපදිංචි කාර්‍යාලයක් පවත්වාගෙන යන අතර එහි මූලික ව්‍යාපාර ඇඹිලිපිටිය සහ බුත්තල ප්‍රදේශවල පවත්වාගෙන යයි. පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි වුවාට පසු පැල්වත්ත සීනි කර්මාන්තයේ සහ සෙවනගල සීනි කර්මාන්තයේ වත්කම් සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම වෙත 2012 ඔක්තෝම්බර් 01 වැනි දින පවරන ලදී.

1.2 පරම ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

මූල්‍යමය ප්‍රකාශනය අමතන කාලසීමාව තුලදී සමාගමේ මූලික ක්‍රියාකාරකම වුයේ උක් වගාවේ යෙදීම, සීනි සහ එතනොල් නිෂ්පාදනයෙහි යෙදීම වෙයි.

1.3 නිකුත් කිරීමට බලාත්මක කෙරුනු දිනය

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ 2013 දෙසැම්බර 31 දින අවසන්වූ වසර වෙනුවෙන් මූල්‍යමය ප්‍රකාශනය නිකුත් කිරීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 අප්‍රේල් 04 වන දින කරන ලද නිශ්චය අනුව බලාත්මක කරන ලදී.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍යමය ප්‍රකාශනවලට අදාල සටහන්

2013 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

2. පොදු ප්‍රතිපත්ති

2.1 සැකසුම් කිරීමට පදනම

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුල මූල්‍යමය තත්වය පිළිබඳ ප්‍රකාශනය, ලාභ අලාභ ප්‍රකාශනය, අනෙකුත් සමස්ථ ආදායම පිළිබඳ ප්‍රකාශනය, ස්කන්ධයෙහි වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය, අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් ඇතුලත් වේ.

එසේ නොවන බව සඳහන්වන අවස්ථාවන්හිදී හැරෙන්නට මූල්‍යමය ප්‍රකාශනය සැකසුම් කර ඇත්තේ ඓතිහාසික වියදම් පදනමක් මතය.

මූල්‍යමය ප්‍රකාශනයේ අගයන් දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි. (රු.)

2.1.1 අනුගතවීමේ ප්‍රකාශය

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ මෙම මූල්‍යමය ප්‍රකාශනය ශ්‍රී ලංකාවේ ගණකාධිකරන ප්‍රමිතීන් (**SLFRS / SLKAS**) හා අනුකූලව සැකසුම් කර ඇත. මෙම මූල්‍යමය ප්‍රකාශනය සැකසුම් කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව කර ඇත.

2.1.2 ව්‍යාපාරය පවත්වාගෙන යාම

අධ්‍යක්ෂකවරුන් සමාගම පවත්වාගෙන යාමට ඇති විභවය පිළිබඳව තක්සේරුවක් කිරීමෙන් අනතුරුව එය ඇවර කිරීමට හෝ එහි වෙළඳම් කටයුතු අවසන් කිරීමට එරෙහිව තීරණය කලෝය.

2.1.3 සැසඳීම සඳහා තොරතුරු

වත්මන් කාල සීමාවට අදල මූල්‍යමය ප්‍රකාශනය 2013 ජනවාරි 01 සිට 2013 දෙසැම්බර් 31 දක්වා පරිච්ඡේදයට අයත් මාස 12ක කාල සීමාවේ ප්‍රතිඵල මත පදනම් වී ඇත. මූලික කාල සීමාව 2012 ඔක්තෝම්බර් 01 සිට 2012 දෙසැම්බර් 31 දක්වා තෙමසක කාල සීමාවයි.

2.2 සුවිශේෂ ගණකාධිකරණ ප්‍රතිපත්තිවල සංක්ෂිප්තය

සමාගමේ ඒකාබද්ධ මූල්‍යමය ප්‍රකාශනය සැකසීමෙහිලා භාවිතා කර ඇති සුවිශේෂ ගණකාධිකරණ ප්‍රතිපත්ති පහත දැක්වෙයි :

2.2.1 ක්‍රියාත්මක සහ නියෝජන මුදල් ඒකකය

සමාගමේ මූල්‍යමය ප්‍රකාශනය තුල ක්‍රියාකාරී ලෙස ඉදිරිපත් කර ඇති ව්‍යවහාර මුදල සමාගමේ ගණුදෙනුවලට පදනම්වන ශ්‍රී ලංකා රුපියලයි. විදේශ විනිමය හරහා කෙරෙන ගණුදෙනු, ගණුදෙනු දිනයේ පවතින නීත්‍යානුකූල විනිමය අනුපාතය අනුව ගණනය කරමින් රුපියල් වලට මාරු කරනු ලැබේ.

විදේශ විනිමය හරහා කෙරෙන ගණුදෙනු එම ගණුදෙනු දිනයේ පවතින නීත්‍යානුකූල විනිමය අනුපාතය අනුව මුල් අවස්ථාවේ සටහන් වන නමුත් සමාගමෙහි විදේශ මුදල් වලින් සටහන්වන මූල්‍යමය වත්කම් සහ බැරකම් අරභයා වාර්ථාකරන දිනයේදී පවතින විනිමය අනුපාත අනුව නැවත ගණනය කරනු ලැබේ.

වෙනස්කම් සියල්ලක්ම ආදායම් ප්‍රකාශනය තුලට අන්තර්ගත කරනු ලැබේ.

ඓතිහාසික පිරිවැයට විදේශ මුදලෙන් සටහන් වන මුදල්මය නොවන වත්කම් සහ වගකීම් ගණනය කෙරෙනුයේ එම ගණුදෙනු කර දිනයේ පැවතුනු විනිමය අනුපාතය අනුවය. සාධාරණ අගයකට නිශ්චය කරන ලද විනිමය අනුපාත අනුව විදේශ මුදලින් අගය කරන ලද මූල්‍යමය නොවන දෑ ගණනය කිරීම සාධාරණ අගයක් සේ නිශ්චය වුනු දිනයේ පැවතුනු විනිමය අනුපාත ඔස්සේ ඉටු කරනු ලැබේ. මූල්‍යමය නොවන දෑ නැවත ගණනය කිරීමේදී ඇතිවන ලාභ හෝ අලාභ සලකනුයේ එම භාණ්ඩවල සාධාරණ අගයන්ගේ වෙනස්වීම කරණකොටගෙන සිදුවන ලාභ හෝ අලාභ හඳුනාගැනීමට සාපේක්ෂවය.

(මෙයින් අදහස් වන්නේ වෙනත් සමස්ත ආදායම්, ලාභ සහ අලාභ යටතේ හඳුනාගනු ලබන විදේශ මුදලින් රුපියල් වලට හැරවීම නිසා සිදුවන ලාභ සහ අලාභවල සාධාරණ අගයන්ට අදල භාණ්ඩ වල මෙම හැරවීම් ආශ්‍රිතව මතුවන මිල වෙනස්වීම්වල සාධාරණ අගයන්ද වෙනත් සමස්ත ආදායම්, ලාභ සහ අලාභ යටතේ හඳුනාගනු ලැබෙන බවයි.)

මූල්‍යමය ප්‍රකාශනවලට අදාල සටහන්

2013 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

2.2.2 ආදායම හඳුනාගැනීම

ආදායම මුදල් වශයෙන් නොලැබී තිබුනත් එය සමාගමට ආර්ථික ප්‍රතිලාභ වශයෙන් ගලා ඒමට තිබෙන අවකාශය සහ එය විශ්වාසවන්තව මිනුම් කිරීමේ හැකියාව මත එය ආදායමක් වශයෙන් හඳුනාගනු ලැබේ. ආදායම මිනුම් කිරීම සඳහා ලැබී තිබෙන හෝ ලැබෙන්නට තිබෙන පිළිසිටුවේ සාධාරණ අගය ගිවිසුම්ගත ගෙවීමේ නියමයන්ගේ නිර්වචයන් සමග සලකා බැලීමක් කෙරේ. මෙයට බදු සහ තීරු බදු ඇතුලත් වන්නේ නැත. සමාගම ආදායම් මාර්ග තක්සේරු කිරීම සඳහා ඒවා තුල සමාගම ප්‍රමුඛයා ලෙස හෝ නියෝජිතයා ලෙස ක්‍රියා කරන්නේදැයි නිශ්චය කිරීම සඳහා විශේෂිත නිර්ණායකයන් භාවිතා කරයි. සමාගම එහි සියළු ආදායම් මාර්ග තුල ප්‍රමුඛයා වශයෙන් ක්‍රියා කිරීමට තීරණය කර ඇත. යමක් ආදායම වශයෙන් හඳුනා ගැනීමට ප්‍රථම එය පහත සඳහන් නිර්ණායකයන් සමග අනුකූල වන බවට සහතික කර යුතුවේ.

භාණ්ඩ විකිණීම

භාණ්ඩයක් විකිණීමෙන් ආදායමක් වශයෙන් සලකනු ලබන්නේ එහි වැදගත් අවදානම් සහ හිමිකමේ ප්‍රතිලාභ, හිමිකරුවෙකුට අයත් වන කළමනාකරණ ආතුලිත වීමකින් හෝ සාධනීය පාලන අයිතියකින් සමාගම තොරවී, ගැණුම්කරුට පැවරී ඇති විටය.

පොලී ආදායම්

කාලීන ණය සහනයක් යටතේ මිලට ගෙන විකිණීමට ප්‍රදර්ශනය කර තිබෙන භාණ්ඩ ණය පදනමක් යටතේ විකිණීමට අදලව වැයවන වියදම සහ උපයන ආදායම ගණනය කරනුයේ සාධනීය පොලී අනුපාතය අනුවය. සාධනීය පොලී අනුපාතය අනාගතයේ මේ වෙනුවන් දරන වියදම් හෝ ලබන ආදායම් වත්කමේ හෝ බැරකමේ ශුද්ධ ධාරණ අගයට නිසියාකාරව ගැලපෙන්නට සලස්වන සාධකයයි. පොලී ආදායම් ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායම යටතේ හුවා දක්වනු ලැබේ.

වත්කම් විකිණීමේදී ලාභ සහ අලාභ

වත්කම් විකිණීමේදී ලාභ හෝ අලාභ ගණනය කරනුයේ ශුද්ධ විකුණුම් මුදල් වත්කමේ ධරණ අගය හා සැසඳීමෙනි. ආදායම් ප්‍රකාශනයේ ශුද්ධ අගයක් සේ මෙය "අනෙකුත් මෙහෙයුම් ආදායම්" යටතේ හඳුනාදෙනු ලැබේ. නැවත අගය කරන ලද භාණ්ඩ විකුණූ විට නැවත අභය කිරීමෙන් එළඹී ඇති වැඩි මුදල ආදායම් ශීර්ෂය යටතට පැවරීමක් කෙරේ.

2.2.3 බදු අය කිරීම

යාවත් කාලීන බදු

ආදායම් බදු සමන්විත වනුයේ යාවත් කාලීන බදු වලිනි. ස්කන්ධය තුල සෘජුව හඳුනාගනු ලබන දෑ වලට අදල බදු ස්කන්ධය තුල අඩංගු අතර මීට අමතර දෑ වලට අදල ආදායම් බදු වියදම් ලාභ අලාභ යටතේ හඳුන්වාදෙනු ලැබේ.

යාවත් කාලීන බදු යනුවෙන් අදහස් කරනුයේ පෙර වසරවලට ගෙවිය යුතුවන ගැලපුම් මුදල් සමග අදල කාල සීමාවට, බදු ගෙවිය යුතු ආදායම සඳහා වාර්ථා කරන දිනයට අදල බදු අනුපාත අනුව ගෙවිය යුතු බදුවේ.

විකුණුම් බදු

පහත සඳහන් අවස්ථාවල හැරෙන්නට ආදායම්, වියදම් සහ වත්කම් විකුණුම් බදු වලින් තොරව සලකනු ලැබේ :

* භාණ්ඩයක් මිලට ගැනීමේදී ගෙවීමට සිදුවන විකුණුම් බද්ද බදු බලධාරියාගෙන් නැවත ලබාගැනීමේ හැකියාවක් නොමැති අවස්ථාවක. මෙම අවස්ථාවේදී එම බද්ද භාණ්ඩයේ මිලට අයත් වන බවට සලකනු ලැබේ.

* ලැබිය යුතු හා ගෙවිය යුතු දෑ විකුණුම් බදු ඇතුලත්ව සටහන් කරන විටදී

බදු බලධාරියාගෙන් නැවත ලබාගත හැකි හෝ බලධාරියාට ගෙවිය යුතුවන ශුද්ධ බදු ප්‍රමාණය මූල්‍යමය තත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු හෝ ලැබිය යුතු අගයන් වශයෙන් දක්වනු ලැබේ.

මූල්‍යමය ප්‍රකාශනවලට අදාල සටහන්

2013 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

2.2.4 වියදම්

ව්‍යාපාරය කරගෙන යාමේදී සිදුවන වියදම් සියල්ලක්ම එම කාල සීමාවේ ලාභය ගණනය කිරීම සඳහා ආදායමට බැර කර ඇත.

පිලිසකර කිරීම් සහ ප්‍රතිසංස්කරණය කිරීම් වලට අයත් වියදම් එම වියදම සිදුවූ කාල සීමාවේ ලාභ අලාභ වලට බැර කරනවා ඇත.

2.2.4.1 ණය ගැනීමේ මිල

ණය ගැනීමට අයත් වියදම්, එම වියදම එම වත්කම මිලදී ගැනීමට, ගොඩනැගීමට, හෝ නිෂ්පාදනය කිරීමට සෘජුව දායක වන්නේ නම් එය එම වත්කමේ මිලට අන්තර්ගත කරන අතර ඉන් බැහැර අවස්ථාවන්හිදී එම වියදම එම කාලව සීමාවේ වියදමක් ලෙස හඳුනාගැනේ.

2.2.4.2 මූල්‍ය වියදම්

මූල්‍ය සැපයීමේ වියදමට අයත්වන්නේ ණයට ගෙන තිබෙන මුදලට අයවන පොලි වියදමයි. මෙය සෘජුව ලාභ අලාභ සේ හඳුනාගැනේ. වත්කම මිලදී ගැනීමට, ගොඩනැගීමට, හෝ නිෂ්පාදනය කිරීමට සෘජුව දායක නොවන්නේ නම් එය ලාභ අලාභ ගිණුමේ සථලදයී පොලි ක්‍රමවේදය අනුව ගිණුම්ගත කෙරේ.

2.2.5 දේපල, පිරියත සහ උපකරණ

ක්‍රමානුකූලව එකතුවුනු ක්ෂයවීම් හෝ පලුදුවීම් හරහා අලාභ ඇත්තේ නම් දේපල, පිරියත, සහ උපකරණවලට අදාල මිල සඳහන් වන්නේ එම අලාභයන්ගෙන් තොරවය. හඳුනාගැනීමේ නිර්ණායකයන් සම්පූර්ණවී ඇත්තේ නම් එම මිලට දේපල, පිරියත සහ උපකරණවලට අයත් කොටස් හිලවිකිරීමේ, දිගුකාලීන ව්‍යාපෘති සඳහා ණය ගැනීමේ වියදම්ද ඇතුලත්වේ. දේපල, පිරියත සහ උපකරණවල වැදගත් කොටස් විටින් විට ආදේශ කිරීම අවශ්‍ය වන විට මෙම වත්කම තනිව සලකා එහි ප්‍රයෝජනවත් කාලසීමාව අනුව ක්ෂයවීම ගණනය කරනු ලැබේ. ඒවගේම විශාල පරිමාණයේ පරීක්ෂණයක් පැවැත්වූ විට එම පරීක්ෂණයට අදාල වියදම එම ගොඩනැගිල්ල හෝ යන්ත්‍රෝපකරණය, ආදේශ කරන ලද්දක් සේ සලකා, ප්‍රකාශනය තුල ඒ වෙනුවෙන් සඳහන් මිල හඳුන්වාදෙනු ලැබේ. අනෙකුත් සියළු පිලිසකර කිරීමේ හෝ නඩත්තු කිරීමේ වියදම් ආදායම් ප්‍රකාශනයේ හඳුනාදෙනු ලැබේ.

වත්කමකින් අනාගතයේදී ලැබෙන ආර්ථික ප්‍රතිලාභය වඩාත් නිවැරදිව පෙන්නුම් කිරීමට එය ඉවහල්වන බැවින් තක්සේරුගත ප්‍රයෝජනවත් ආයුකාලයට සාපේක්ෂව සරල රේඛා ක්‍රමවේදයක් මත පදනම්ව දේපල, පිරියත සහ උපකරණවල ක්ෂයවීම ගණනය කර ආදායම් ප්‍රකාශනය තුල හඳුන්වා දෙනු ලැබේ.

වත්කමක ක්ෂයවීම ආරම්භවන්නේ එය භාවිතාවට සුදුසු තත්වයට පත්වන අවස්ථාවේදීය (එනම් කළමනාකරණයට අවශ්‍යවන පරිදි භාවිතයේ යෙදීමට සුදුසු ස්ථානයේදී සුදුසු තත්වයට පත්වුන අවස්ථාවේදීය). වත්කමක ක්ෂයවීම අවසන් වන්නේ එය **SLFRS 5** අනුකූලව විකිණීමට නියමවූ බවට වර්ගීකරණයවී ඇති හෝ එය හඳුනාගැනීමෙන් ඉවත්වී ඇති දින දෙකෙන් ඉස්සරවන දිනයේදීය.

වත්කමක් සම්පූර්ණයෙන් ක්ෂයවී නොමැති නම් එය ප්‍රයෝජනවත් භාවිතයෙන් තොරවූ පමණින් ක්ෂයවීම අවසන් වන්නේ නැත. ආරම්භයේදී හඳුනාගනු ලැබූ දේපල, පිරියත හා උපකරණයක් හෝ එහි වැදගත් කොටසක් හඳුනාගැනීමෙන් තොර බවට පත්වන්නේ එය විකිණීමට පත්වුවාටට පසු හෝ එය භාවිතයේ යෙදීමෙන් ආර්ථික ප්‍රතිලාභ එයින් තවදුරට බලාපොරොත්තු විය නොහැකි තත්වයකදීය. වත්කමක් හඳුනාගැනීමෙන් තොරවුවාට පසුව ඇතිවන ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ විකුණුම් මිල සහ එම වත්කමේ ධාරණ අගය අතර ඇති වෙනස අනුව ගණනය වන) ආදායම් ප්‍රකාශනයේ පෙන්නුම් කර ඇත.

මූල්‍යමය වසරාන්තයයේදී වත්කමේ අවශේෂ අගය, ආයු කාලය, ක්ෂයවීමේ ක්‍රමවේදය යනාදිය සමාලෝචනයට ලක්වී සුදුසු අවස්ථාවන්හිදී පෙරදිසි පරිදි ගලපනු ලබයි.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍යමය ප්‍රකාශනවලට අදාල සටහන්

2013 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

2.2.6 කල් බදු

යම් වැඩපිලිවෙලකට කල් බදු ඇතුලත් වේදැයි තීරණය වන්නේ ආරම්භක දිනයේදී එම වැඩපිලිවෙලට ඇතුලත් වන හරය මත සහ එම වැඩපිලිවෙල සාක්ෂාත් කරගැනීමෙහිලා විශේෂිත වත්කමක් හෝ වත්කම් අත්‍යවශ්‍ය වන්නේදැයි අනුවය. වැඩපිලිවෙලෙහි එම වත්කම භාවිතා කිරීමට අයිතියක් ඇති බව ප්‍රතිඃක්ෂ නොවන අන්දමකට හෝ සඳහන්වී ඇත්නේද අනුවත් එය තීරණය වේ.

සමාගම මූල්‍ය කල්බදු දීමනාකරු වූ විට

බද්දට ලක්වී ඇති භාණ්ඩයේ හිමිකාරිත්වයට අයත් සෑම අවදානමක් සහ ප්‍රතිලාභ සමාගමට පවරන මූල්‍ය කල් බදු ආශ්‍රිතව බද්දට දී ඇති දේපලෙහි සාධාරණ අගයට හෝ, ඊට අඩුනම්, බද්දට අයත් අවම ගෙවීමේ වත්මන් අගයට, මූලාරම්භයේදීම ප්‍රාග්ධනගත කරන ලදී. බැරකමේ ඉතිරි ශේෂයේ පොලි අනුපාතය වෙනස් නොවන තත්වයක නඩත්තු කිරීමට, මූල්‍ය ගාස්තු සහ බදු බැරකම අඩුකිරීම අතර බද්දට අයත් ගෙවීම් පංගුකර ඇත.

මූල්‍ය ගාස්තු හඳුනාගනු ලබන්නේ ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය වියදම් යටතේය.

බද්දට ගත් භාණ්ඩයක් එහි ප්‍රයෝජනවත් ආයුකාලය තුලදී ක්ෂයවීමකට ලක්වේ. එනමුත් බදු කාලසීමාව අවසානයේදී සමාගම හිමිකාරිත්වය ලබාගැනීම සම්බන්ධව සාධාරණ නිශ්චිත භාවයක් නොමැති අවස්ථාවක බදු කාලසීමාව හෝ වත්කමේ තක්සේරුගත ප්‍රයෝජනවත් ආයුකාලය අතර වඩාත් අඩු කාල සීමාව තුල වත්කම ක්ෂය වීමට ලක්වේ.

මෙහෙයුම් කල් බදු ගෙවීම් ආදායම් ප්‍රකාශනයේ මෙහෙයුම් වියදම් යටතේ බදු කාලසීමාව තුලදී සරල රේඛා පදනමක් මත හඳුනාගනු ලැබේ.

2.2.7 තොග

යල්පැනපු විකිණීමට අඩු ප්‍රවණතාවයක් සහිත භාණ්ඩවලට නිසි ගැලපුම් කල පසුව එම භාණ්ඩ අගය කෙරෙන්නේ නියමිත මිල සහ ශුද්ධ උපලබ්ධි අගය අතර අඩු අගයටය. ශුද්ධ උපලබ්ධි අගය ගණනය වන්නේ බඩු ලේඛනගත භාණ්ඩ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු හරහා විකිණිය හැකි මිලෙන් එම විකිණීම සිදුකිරීමට වැයවන මුදල අඩුකල විටය.

තොග වත්මන් ස්ථානයට සහ තත්වයට ගෙන ඒම සඳහා වැයවූ මුදල ගණනය කිරීම සඳහා පහත දැක්වෙන සමීකරණය භාවිතාවේ. :

නිෂ්පාදන තොග - ශේෂ පත්‍රය සැකසුනු දිනය දක්වා වැය වුනු අමතර වියදම් ඇතුලු සියළු සෘජු වියදම්

උක් ගස් නගා සිටුවීම සඳහා - ශේෂ පත්‍රය සැකසුනු දිනය දක්වා වැය වුනු අමතර වියදම් සහ පැල තවානට අයත් වියදම් ඇතුලු සියළු සෘජු වියදම්

අනෙකුත් තොග - සැබෑ වියදම

මාර්ගස්ථ තොග - සැබෑ වියදම

2.2.8 මූල්‍යමය මෙවලම් - ආරම්භක හඳුනාගැනීම සහ ඉන් අනතුරුව කෙරෙන අගය කිරීම

i) මූල්‍යමය වත්කම්

ආරම්භක හඳුනාගැනීම සහ අගය කිරීම

LKAS 39 අවකාශය තුල සාධාරණ අගයන් සහිත මූල්‍යමය වත්කම් වශයෙන් වර්ගීකරණය වන්නේ ලාභ/අලාභ, ණය සහ ලැබිය යුත්තන්, කල්පිරීම දක්වා ආයෝජන, විකිණීමට ඉදිරිපත්කර ඇති භාණ්ඩ, ප්‍රායෝගික ඉදිරි ආරක්ෂාව සඳහා යොදවන ඉදිරි ආරක්ෂක මෙවලම් ආදිය වේ. සමාගම තම මූල්‍යමය වත්කම්වලට අදාල වර්ගීකරණය ආරම්භක හඳුනාගැනීමේදී තීරණය කරයි.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍යමය ප්‍රකාශනවලට අදාල සටහන්

2013 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

සාධාරණ අගයන් හරහා ලාභ/අලාභ යටතේ හඳුනාගනු ලබන මූල්‍යමය වත්කම් හැරෙන්නට අන් සියළු මූල්‍යමය වත්කම්වල සාධාරණ අගයන් ගණුදෙනු වියදම් සමග මුල් වශයෙන් හඳුනාගනු ලැබේ.

වෙළඳපොලේ නියමයන් හෝ සම්මතයන් අනුව යම් කාලසීමාවක් ඇතුලත ගණුදෙනුවකට ලක්විය යුතු වත්කම් (විධිමත් ආරයේ වෙළඳම්) වෙළඳම සිදුවූ දිනයේදී (එනම් සමාගම විකිණීමට හෝ මිලදී ගැනීමට තීන්දු කල දිනයේදී) හඳුනාගනු ලැබේ.

සමාගමේ මූල්‍යමය වත්කම්වලට අත්පිට මුදල්, කෙටිකාලීන තැන්පතු, විකුණුම් සහ අනෙකුත් අයවිය යුත්තන්, ණය, වෙළඳපොලේ අප්‍රකාශිත මූල්‍යමය මෙවලම් සහ ව්‍යුත්පත්ත මූල්‍යමය මෙවලම් අයත්වේ,

අනතුරුව කරන්නට යෙදෙන මිණුම්

මූල්‍යමය වත්කම්වලට අදල මිණුම් ඒවායේ වර්ගීකරණය අනුව වෙනස්වේ, ඒවා පහත දැක්වෙන පරිදි විස්තර වේ :

ණය සහ අයවිය යුත්තන්

ණය සහ අයවිය යුත්තන් වෙළඳපොලේ අප්‍රකාශිත ස්ථිර නිශ්චය කර හැකි ගෙවුම් සහිත ව්‍යුත්පත්ත නොවූ මූල්‍යමය වත්කම් වෙයි. ආරම්භක හඳුනාගැනීමෙන් පසුව, මෙවැනි වත්කම් මිණුම් කරනු ලබන්නේ සැබැවින් බලාත්මක වන පොලි අනුපාත ක්‍රමවේදය අනුව කොටස් කල මිලෙන් අපවර්තීම අඩුකලාට පසුවය. කොටස් කරන ලද මිල ගණනය කිරීම සාධනීය පොලී අනුපාතයේ අනුවය. අන්තර්ගත කොටසක් වශයෙන් අත්පත්කර ගැනීමේ වියදම්, ගාස්තු යනාදියට ලැබෙන වට්ටම් සලකා බලනු ලැබේ. සාධනීය පොලී අනුපාත කොටස් කිරීම ආදායම් ප්‍රකාශනයේ මුදල් සැපයීමේ ආදයම යටතේ හඳුනාගැනුගනු ලැබේ. අපචයවීම හරහා සිදුවන අලාභ ආදයම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබෙන්නේ ණය සඳහා මූල්‍ය වියදම් හෝ විකුණුම්වලට අදල වියදම් හෝ අනෙකුත් අයවිය යුත්තන්ට අදල මෙහෙයුම්වල වියදම් ඔස්සේය.

හඳුනාගැනීම අවසන් කිරීම

මූල්‍යමය වත්කමක් හෝ එවැනි වත්කමකින් කොටසක් හෝ එවැනි වත්කම් සමූහයකින් කොටසක් හඳුනාගැනීමෙන් තොර වන්නේ:

* එම වත්කමෙන් මුදල් සංසරණය ලබාගැනීමට අයිතිය අහෝසිවූ විට

* සමාගම එම වත්කමේ මුදල් සංසරණය ලබාගැනීමේ අයිතිය පවරා ඇති විටෙක හෝ කිසිම භෞතික ප්‍රමාදයකින් තොරව ලබාගත් මුදල් සංසරණය තුන්වැනි පාර්ශවයකට විනිවිද එකඟතාවයක් යටතේ පැවරීමට වගකීමක් භාරගෙන තිබෙන විටෙක සහ අ) සමාගම වත්කමේ සියළු අවදානම් සහ ප්‍රතිලාභ පවරා ඇති විටෙක ආ) සමාගම වත්කමේ සියළු අවදානම් සහ ප්‍රතිලාභ පවරා නොමැතිව නමුත් එහි පාලනය පවරා ඇති විටෙක

සමාගම වත්කමක මුදල් සංසරණය ලබාගැනීමේ අයිතිය පවරා ඇති විටෙක හෝ විනිවිද එකඟතාවයක් යටතේ පැවරීමට වගකීමක් භාරගෙන තිබෙන විටෙක සමාගම විසින් එම වත්කමේ අවදානම් සහ ප්‍රතිලාභ පවරා ඇති ප්‍රමාණය පිළිබඳව ඇගයීමක යෙදෙනු ලැබේ. එම ඇගයීමේදී සමාගම සියළු අවදානම් සහ ප්‍රතිලාභ පවරා නොමැති බව හෝ පාලනය පවරා නොමැති බව වැටහෙන්නට වුවහොත් සමාගම එම වත්කම තම වගකීම යටතේ පවතින ප්‍රමාණය අනුව හඳුනාගැනීමක් කරයි. මේ අවස්ථාවේදී සමාගම ඒ හරහා පවතින යම් බැරකමක්ද හඳුනාගනී, පවරනු ලැබූ වත්කම සහ ඊට අදල බැරකම සමාගමේ නිම්කමට අයත්වී පවතින වගකීම අනුව ගණනය කරනු ලැබේ.

පවරනු ලැබූ වත්කම සම්බන්ධව ඇපයක ස්වභාවයෙන් යම් වගකීමක් තවමත් පවතී නම් එය ගණනය කරනුයේ එහි අවම ධාරණ අගය සහ එය නිසා නැවත ගෙවීමට සිදුවිය හැකි උපරිමය සලකා බැලීමෙන්ය.

මූල්‍යමය ප්‍රකාශනවලට අදාල සටහන්

2013 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

ii) මූල්‍යමය වත්කම් අපචය වීම

සෑම වාර්ථා කරන දිනයකදීම මූල්‍යමය වත්කමක් හෝ වත්කම් සමූහයක් අපචය වීම පිළිබඳ යම් සාධනීය සාක්ෂ්‍යයක් තිබේදැයි සමාගම තක්සේරු කර බලයි. මූල්‍යමය වත්කමක් අපචයවී ඇති බවට තීන්දු වන්නේ එය මුලින් හඳුනාගත් පසුව යම් සිද්ධීන් මාලාවක් කරණකොටගෙන එය අපචයවූ බවට සාධනීය සාකෂ්‍යය ඉදිරිපත් වුවහොත් පමණි (අලාභ සහගත සිද්ධියක්). මෙම අලාභ සහගත සිද්ධිය කරණකොටගෙන එම වත්කමේ හෝ වත්කම් සමූහයේ තක්සේරුගත අනාගත මුදල් සංසරණය වෙත විශ්වාසවන්තව ගණනය කල හැකි බලපෑමක් සිදුවී ඇති විය යුතුවේ. අපචයවීමේ සාක්ෂ්‍ය වශයෙන් ණයකරුවන් කිහිපදෙනෙකු මූල්‍යමය අපහසුතාවයන්ට ගොදුරුවීම, මුල් ධනය හෝ පොලිය නොගෙවීම හෝ අදුවණතාවය, ඔවුන් බුන්වත් බවට පත්වීමේ හැකියාව පෙන්නුම් කිරීම, නිරීක්ෂණය කරන දත්ත මගින් අනාගත මුදල් සංසරණයන්හි සැලකියයුතු පසුබැසීමක් ඇතිවිය හැකි බවට තක්සේරුවීම සැලකිය හැක. (මීට හිඟ මුදලේ සැලකිය යුතු වෙනස්වීම් හෝ ගෙවීම් නොකිරීමට තුඩුදෙන ආර්ථික තත්වයන් නිර්මාණය වීම ඇතුලත් වේ,)

කොටස්කරන ලද ධාරණ අගයන් සහිත මූල්‍යමය වත්කම්

කොටස්කරන ලද ධාරණ අගයන් සහිත මූල්‍යමය වත්කම් පිළිබඳව තනි වශයෙන් වැදගත්වන වත්කම් තනි වශයෙන්ද සාමූහිකව වැදගත්වන වත්කම් සාමූහිවද තක්සේරුවට ලක්කරමින් අපචයවී ඇති බවට සාධනීය සාකෂ්‍යය තිබේදැයි සමාගම නිගමනය කරයි, තනිව තක්සේරුවට ලක් කරන ලද වත්කමක් අපචයවීම්කින් තොරබව නිගමනය කර විට එය වැදගත් නොවූවත්, ඊට සමාන මූල්‍යමය අවදානම් ලක්ෂණ සහිත වත්කම් සමූහයකට එය ඇතුලත් කර සමූහයක් වශයෙන් අපචවීම පිළිබඳ තක්සේරුවකට භාජනය කරනු ඇත. තනිව තක්සේරු කරන ලද වත්කමක අලාභයක් නිරීක්ෂණය කර ඇති විට හෝ අලාභයක් තවදුරටත් පවතින විට ඒ වත්කම අපචය වීමේ සාමූහික තක්සේරුවකට ඇතුලත් කරන්නේ නැත.

අපචයවී ඇති බවට සාධනීය සාකෂ්‍යය තිබෙන බවට සමාගම නිගමනය කරන විටක අලාභය ගණනය කිරීමට වත්කමේ ධරණ අගය සහ එහි අනාගත මුදල් සංසරණය පිළිබඳව තක්සේරුවේ වත්මන් අගය සලකා බලනු ලැබේ (තවමත් සිදුවී නැති අනාගත ණය අලාභ මෙයට අඩංගු වන්නේ නැත). වත්කමේ අනාගත මුදල් සංසරණය පිළිබඳව තක්සේරුවේ වත්මන් අගය මුල් සාධනීය පොලි අනුපාතයෙන් අඩු කරනු ලැබේ. ණයක පොලී අනුපාතය වෙනස්වනසුළු වන විට අපචයවීමට අදල අලාභය ගණනය කිරීමට භාවිත කරන අනුපාත වට්ටම් වනුයේ වත්මන් සඵලදායී පොලී අනුපාතයයි,

වත්කමේ ධාරණ අගය විවේචන ගිණුමක් හරහා අඩුකර, අලාභයේ ප්‍රමාණය ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ, අඩුකරන ලද වත්කමේ ධාරණ අගයට පොලී ආදායම එකතුවීමෙන් පවතින අතර මෙහිදී බලපාන පොලිය වන්නේ අපචයවීමේ අලාභය ගණනය කිරීම සඳහා අනාගත මුදල් සංසරණ අඩු කිරීමට භාවිතා කල පොලී අනුපාතයයි. මීට අදල පොලි ආදායම ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායම් යටතේ හඳුනාගනු ලැබේ, ණයකට අදල ඇප සියල්ලක්ම සමාගමට පවරාගෙන ඇති විටක තව දුරට ගෙවීමක් බලාපොරොත්තු විය නොහැකි තත්වයක් උදවී ඇත්නම් එම ණය පොත් වලින් අස්කර දමනු ලැබේ. අන්තිමට අපචයවීමකින් අලාභය හඳුනාගත් පසුව සිදුවීමක් නිසාවෙන් අපචය අලාභ අගයක වැඩිවීමක් හෝ අඩුවීමක් සිදුවන අවස්ථාවක දැනට හඳුනාගෙන ඇති අපචය අලාභය විවේචන ගිණුමේ වැඩිකිරීමෙන් හෝ අඩු කිරීමෙන් ගලපනු ලැබේ. පොත්වලින් අස්කර දැමූ ණයක් පසුකලක නැවතත් ලබාගතහොත් එම අගය ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය වියදමට බැර කරනු ලැබේ.

iii) මූල්‍යමය වගකීම්

ආරම්භක හඳුනාගැනීම සහ අගය කිරීම්

LKAS 39 අවකාශය තුල සාධාරණ අගයන් සහිත මූල්‍යමය වගකීම් වශයෙන් වර්ගීකරණය වන්නේ ලාභ/අලාභ, ණය සහ ණයට ගැනීම් හෝ ප්‍රාංයෝගික ඉදිරි ආරක්ෂාව සඳහා යොදවන ඉදිරි ආරක්ෂක මෙවලම් ආදිය වේ. සමාගම තම මූල්‍යමය වගකීම්වලට අදල වර්ගීකරණය ආරම්භක හඳුනාගැනීමේදී තීරණය කරයි. සියළු මූල්‍යමය බැරකම් මුල් වශයෙන් සාධාරණ අගයන් හරහා හඳුනාගනු ලබන අතර ණය සහ ණය ගැනීම් අදලව ඒවාට සම්බන්ධව සෘජුව හඳුනාගත හැකි ගණුදෙනු වියදම්ද ඊට එකතු කරනු ලැබේ.

වෙළඳ, අනෙකුත් ගෙවීම්, බැංකු අයිරාවන් සහ වෙනත් ණය සමාගමේ මූල්‍යමය බැරකම්වලට ඇතුලත් වේ,

අනතුරුව කරන්නට යෙදෙන මිණුම්

මූල්‍යමය බැරකම්වලට අදල මිණුම් ඒවායේ වර්ගීකරණය අනුව වෙනස්වේ, ඒවා පහත දැක්වෙන පරිදි විස්තර වේ:

මූල්‍යමය ප්‍රකාශනවලට අදාල සටහන්

2013 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

ණය සහ ණයට ගැනීම්

ආරම්භක හඳුනාගැනීමෙන් පසුව, පොලි සහිත ණය සහ ණයට ගැනීම් මිණුම් කරනු ලබන්නේ සැබෑවින් බලාත්මක වන පොලි අනුපාත ක්‍රමවේදය අනුව කොටස් කලාට පසුවය. බැරකම් හඳුනාගැනීම අවසන් කරන අවස්ථාවේදී සහ සැබෑ බලාත්මක පොලි අනුපාතය අනුව කොටස් කරන අවස්ථාවේදී ආදායම් ප්‍රකාශනයේ ලාභ සහ අලාභ හඳුනාගැනේ,

පංගුවක මිල ගණය කිරීමට අත්පත් කරගැනීමට වැය වුනු මුල්ගෙවීම්, වට්ටම් සහ ගාස්තු සැබෑ බලාත්මක පොලි අනුපාතයට අන්තර්ගත වන ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ව්‍යදම් යටතේ මෙම කොටස් කිරීම පෙන්නුම් කෙරේ.

හඳුනාගැනීම අවසන් කිරීම

මූල්‍යමය බැරකමක වගකීම සම්පූර්ණ කල විට, අහෝසි කල විට හෝ අවසන්වූ විට එම බැරකමේ හඳුනාගැනීම අවසන් බවට සැලකේ. පවතින මූල්‍යමය බැරකමක් එම ණය සපයන්නා විසින්ම වෙනස් මුදල් බැරකමක් ආදේශ කරන විට හෝ යම් බැරකමක කොන්දේසි සහ නියමයන් සැලකිය යුතු ප්‍රමාණයකින් වෙනස් කරන විට එම වෙනස් කිරීම මූලික බැරකමේ හඳුනාගැනීම අවසන් කරන සාධකය සැටියට සලකා අළුත් ගණුදෙනුව නව බැරකමක් සැටියට හඳුනාගනු ලැබේ, අදල ධාරණ අගයන්වල වෙනස ආදායම් ප්‍රකාශනයේ පෙන්නුම් කරනු ලැබේ.

iv) මූල්‍යමය මෙවලම් අනුලම්බ ගැනීම

මූල්‍යමය වත්කම් හෝ බැරකම් අනුලම්බ ගැනීමක් කර මූල්‍යමය තත්ව ප්‍රකාශනයේ ශුද්ධ අගය පෙන්නතුම් කරනුයේ පහත සඳහන් අවස්ථාවන්හිදී පමණි :

* හඳුනාගත් ප්‍රමාණයන් අනුලම්බ ගැනීමට වර්තමානයේදී බලාත්මක කර හැකි නීතිමය හිමිකමක් ඇති විට
* වත්කම් විකුණා බැරකම් මුදහරින්නට හෝ ශුද්ධ පදනමක් මත බැරකම් සමගාමීව මුදහරින්නට අදහසක් තිබෙන විට

v) මූල්‍ය භාණ්ඩ සඳහා වන සාධාරණ අගය

එක් එක් වාර්තා කරන දිනයන්හිදී ක්‍රියාකාරී වෙළඳපොල තුල වෙළඳමෙහි යෙදෙන මූල්‍යමය මෙවලම්වල සාධාරණ මිල තීරණ වනුයේ ප්‍රකාශිත වෙළඳපොල මිලටත් ගණුදෙනුකරුවන් ප්‍රකාශ කරන මිලටත් සාපේක්ෂව ගණුදෙනු ව්‍යදම සඳහා කිසිවක් අඩු නොකර (දීර්ඝ තත්වයන් සඳහා ලංසු මිලද කෙටි තත්වයන් සඳහා ඉල්ලුම් මිලද) ක්‍රියාකාරී වෙළඳපොල තුල වෙළඳමෙහි නොයෙදෙන මූල්‍යමය මෙවලම්වල සාධාරණ මිල තීරණය කරන්නට සුදුසු ගණන ක්‍රමයක් භාවිතා කෙරේ. පහත සඳහන් ක්‍රමයන් අඩංගු විය හැක :

* මෑතදී සිදුවුන වෙළඳපොල ගණුදෙනු භාවිතා කිරීමෙන්
* හරයේ සමානකම් ඇති වෙනත් මෙවලමක වත්මන් සාධාරණ අගයට සාපේක්ෂකව
* වට්ටම් කරන ලද මුදල් සංසරණ විශ්ලේෂණයක් හෝ වෙනත් ආගණන ආකෘති භාවිතා කිරීමෙන්

2.2.9 අත්පිට මුදල් සහ අත්පිට මුදල් හා සමාන මෙවලම්

අත්පිට මුදල් සහ අත්පිට මුදල් හා සමාන මෙවලම් සමන්විත වන්නේ අත්පිට මුදල් ශේෂ සහ කැඳවුම් මුදල් තැන්පතු වලිනි. මුදල් සංසරණ ප්‍රකාශනයට අදලව, සමාගමේ අත්පිට මුදල් කළමනාකරණයේ වැදගත් කොටසක් වන ඉල්ලුම්කරන අවස්ථාවක ආපසු ගෙවිය යුතුවන බැංකු අයිරාවන්ද අත්පිට මුදල් සහ අත්පිට මුදල් හා සමාන මෙවලම් ඝණයට අඩංගු වේ.

2.2.10 මූල්‍යමය නොවූ වත්කම් අපචය කිරීම

සමාගමේ මූල්‍යමය නොවන වත්කම් අපචය වීමකට ලක්වී ඇත්දැයි නීර්ණය කිරීම සඳහා සෑම වාර්තා කිරීමේ දිනක් පාසා ඒවායේ ධාරණ අගය සමාලෝචනයට ලක් කෙරේ. අපචය වීමකට ලක්වී ඇති බවට සංඥාවක් පෙන්නුම් කර විට වත්කමින් උපයාගත හැකි අගය තක්සේරුගත කරනු ලැබේ. නිශ්චිත ආයුකාලයක් නොමැති හෝ තවමත් භාවිතයේ යෙදිය නොහැකි අස්පෘශ්‍ය වත්කම් හෝ කීර්තිනාමය මත පදනම්වූ වත්කම් ඒවා අපයවය වී ඇති බවට සිදුවීම් මගින් ඇඟවීම් කෙරෙන්නේ නම් සෑම වාර්තා කරන දිනයකදීම හෝ ඊටත් අඩු කාල පරතරයකින් උපයාගත හැකි අගය සඳහා තක්සේරුගත කෙරේ.

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍යමය ප්‍රකාශනවලට අදාල සටහන්

2013 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

2.2.11 අයකරගත හැකි මුදල ගණනය කිරීම

වත්කමක හෝ මුදල් ජනන ඒකකයක අගය වනුයේ එය භාවිතයේ යෙදීමේ අගය සහ එහි සාධාරණ අගය අතර වැඩි අගය වෙයි. විකිණීමට වැයවන මිල මෙම අගයෙන් අඩු කරනු ලැබේ. භාවිතයේ යෙදීමේ අගය ගණනය කිරීම සඳහා තක්සේරුගත අනාගත මුදල් සංසරණ වත්මන් අගයන් කරා ගලපන්නට, කාලීන මුදල් අගයන් සහ වත්කමට විශේෂිත වන අවදානම් වත්මන් වෙළඳපොල විසින් තක්සේරු කිරීම නුවාදක්වන බදු ගෙවීමට පෙර අනුපාත භාවිතා කෙරේ. මුදල් ජනන ඒකකයක් වශයෙන් හඳුන්වනුයේ වෙනත් වත්කම්වලින් සහ සමූහයන්ගෙන් ස්වාධීනව මුදල් සංසරණ ජනනය කරන හඳුනාගත හැකි කුඩාම ඒකකය වෙයි.

2.2.11.1 අපචයවීම සහ අපචයවීම ප්‍රතිවර්තනය කිරීම

අපචයවීමේ අලාභයක් හඳුනාගනු ලබන්නේ වත්කමක ධාරණ අගය හෝ එහි මුදල් ප්‍රජනන ඒකකයට එයට අදල ආපසු ලබාගත හැකි අගය ඉක්මවා යාමට හැකිවූ විටය. අපචයවීමේ අලාභයක් හඳුනාගනු ලබන්නේ ලාභ අලාභ යටතේය. මුදල් ජනන ඒකක අදලව හඳුනාගත් අපචය වීමේ අලාභ වෙන්කෙරෙන්නේ පළමු වශයෙන් එම ඒකක වලට සම්බන්ධ කීර්තිනාමය ධාරණ අගයන් අඩු කිරීමටය. ඉන්පසුව එම එක්කකයට අයත් අනෙකුත් වත්කම්වල ධාරණ අගයන් අනුපාතික පදනමක් මත අඩු කිරීමටය.

කීර්තිනාමය අදල අපචයවීමේ අලාභයක් ප්‍රතිවර්තනය කර නොහැකිය. පෙර කාලයන්හිදී හඳුනාගනු ලැබූ අනෙකුත් වත්කම්වලට අදල අපචය වීමේ අලාභ සෑම වාර්ථා කරන දිනයකදීම තක්සේරු කරනු ලබනුයේ අලාභය අඩුවී ඇති බවට නොහොත් ක්ෂයවී ඇති බවට යම් සංඥාවක් පෙංවාබැලීමටය. තක්සේරුවේ වෙනසක් ඇත්නම් ආපසු ලබාගතහැකි අගය ගණනය කිරීම සඳහා අපචයවීමේ අලාභය ප්‍රතිවර්තනය කෙරේ. අලාභය ප්‍රතිවර්තනය වීමේ සීමාව තීරණය වෙන්නේ එම ප්‍රතිවර්තනය නිසාවෙන් වත්කමේ ධාරණ අගය, අපචය වීම හඳුනාතොගත්තේ නම් ක්ෂය වීමෙන් සහ කොටස් කිරීමෙන් තොරව ගණනය වුනු වත්කමේ ධාරණ අගය නොඉක්මවා යාමෙන්ය.

2.2.12 ප්‍රතිපාදන

2.2.12.1 සාමාන්‍ය

සමාගමකට ඓතිහාසික සිද්ධියක් නිසාවෙන් වර්තමානයේදී (නීත්‍යානුකූල හෝ සම්ප්‍රයුක්ත) වගකීමක් තිබෙන අවස්ථාවක ප්‍රතිපාදන හඳුනාගනු ලබන අතරම, එම වගකීම ඉටු කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිළිඹිඹු කරන සම්පත් පිටතට ගැලීමක් අවශ්‍ය විය හැක. එම වගකීමේ පරිමාණය විශ්වාසවන්තව ගණනය කිරීම සඳහා තක්සේරුවක් කල හැක. රක්ෂණයක් වැනි මෙවලමකින් ප්‍රතිපාදනය මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් නැවත ලබාගන්නට සමාගම බලාපොරොත්තු වන්නේනම් එම නැවත ලබාගැනීම තනි වත්කමක් වශයෙන් සැලකෙන නමුත් එසේ කෙරෙන්නේ එම නැවත ලැබීම සහතික වුවාට පසුවය, කුමන හෝ ප්‍රතිපාදනයකට අදල වියදම ආදයම් ප්‍රකාශනයේ පෙන්නුම් කරන්නේ නැවත ලබාගැනීම් වලින් තොරවය.

මුදලේ කාල වටිනාකම ඔස්සේ අගය කිරීමේ බලපෑම සැලකිය යුත්තක් නම් බැරකමට ආවේනික අවදානම් පිළිඹිඹු කරන බදු ගෙවීමට පෙර අනුපාතයක් ඔස්සේ ප්‍රතිපාදනවලට ගැලපීමක් කල හැක. ගැලපීම සිදුකරන විට කාලය ගෙවීයාම නිසා ප්‍රතිපාදනය වැඩිවීම මූල්‍ය වියදමක් ලෙස හඳුනාගත යුතුවේ.

2.2.12.2 රැකියාවෙන් පසු ප්‍රතිලාභ

i) නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලසුම - පාරිතෝෂිකය

1983 අංක 12 දරන පාරිතෝෂික පනත යටතේ නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලසුමක් සමාගම ක්‍රියාත්මක කරයි. මේ ප්‍රතිපාදනවලට අරමුදලක් නොමැත. මෙම නිර්වචනය අනුව ප්‍රතිලාභ නිගමනය කිරීම පිණිස ප්‍රක්ෂේප්ත බැර ඒකක ක්‍රමවේදය භාවිතා කෙරේ. නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලසුම් දෙකෙහිම ලාභ සහ අලාභ දෙකම සම්පූර්ණයෙන් ඒවා සිදුවන කාල සීමාව තුල ආදයම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. එවැනි සැබෑ ලාභ සහ අලාභ රඳවාගත් ඉපැයුම් වලත් වහාම හඳුනාගනු ලැබේ. මෙවා තදාන්තර කාලසීමාවල ලාභ හෝ අලාභ වශයෙන් නැවත වර්ගීකරණ වන්නේ නැත.

නිහිත නොවූ අතීත සේවා සඳහා වියදම් සරල රේඛා පදනමක් මත වියදමක් සේ නිහිත තත්වයකට පත්වෙන තුරු හඳුනාගනු ලැබේ. විශ්‍රාම සැලසුමක් හඳුනාදීම මගින් හෝ එයට අනුගත වීමෙන් අතීත සේවා නිහත තත්වයකට පත්වුවහොත් එම වියදම් වහා හඳුනාගනු ලැබේ.

නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වත්කම හෝ බැරකම අර්තකථනය කරන ලද ප්‍රතිලාභ වගකීමේ වත්මන් අගයෙන් සමන්විතවේ (රජයේ සුරැකුම් මත යැපෙන වට්ටම් අනුපාතයක් භාවිතා කිරීමෙන් ගණනය වන). මෙයින් හඳුනාතොගත් අතීත සේවා වියදම් සහ වගකීම ඉටුකරන්නට වෙන්කරන වත්කම්වල සාධාරණ අගය අඩුකරනු ලැබේ.

මූල්‍යමය ප්‍රකාශනවලට අදාල සටහන්

2013 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

ii) නිර්වචනය කරන ලද දයක සැලසුම

සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්ති භාරකාර අරමුදලට ඊට අදාල ව්‍යවස්ථානුකූල නියමයන් අනුව දායක වීමට හිමිකම ඇත. සමාගම විසින් සේවයෙකුගේ ඉපැයුම් වලින් 12% සහ 3% අනුපිළිවෙලින් අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්ති භාරකාර අරමුදලට දායක වෙයි.

2.3 සුවිශේෂ ගණකාධිකරණ නිශ්චයන්, තක්සේරු සහ උපකල්පන

සමාගමේ ඒකාබද්ධ මූල්‍යමය ප්‍රකාශන සැකසුම් කිරීමෙහිදී ආදායම්, වියදම්, වත්කම්, බැරකම් ආදිය වාර්ථා කිරීම සහ වාර්ථා කරන කාල සීමාව අවසානයේදී අනාවරණය කෙරෙන අවිනිශ්චිත බැරකම් පිළිබඳව කළමනාකරණයට යම් නිශ්චයන්, තක්සේරු, උපකල්පන කිරීමට සිදුවේ. එනමුත් අනාගතයේ ක්‍රියාත්මක කරන්නට තිබෙන ධාරණ අගයන්, වත්කම් සහ බැරකම් හා සම්බන්ධව සැලකිය යුතු ගැලපුම් පිළිබඳව කරන්නට යෙදෙන තක්සේරු සහ උපකල්පන පිළිබඳව අවිනිශ්චිත තත්වයන් ඇතිවිය හැක.

තක්සේරු සහ උපකල්පන

අනාගතය පිළිබඳව වැදගත් උපකල්පන සහ වාර්ථාකරන දිනයෙහිදී මතුවන, ඊලඟ මූල්‍යමය වසරෙහිදී වත්කම් සහ බැරකම්වල ධාරණ අගයන් කෙරෙහි සැලකිය යුතු ගැලපුම් කරන්නට පොළඹවන සැලකිය යුතු අවදානම් සහිත තක්සේරු කිරීමේ අවිනිශ්චිතතාවයන්ගේ අනෙකුත් වැදගත් මූලාශ්‍ර පහත විස්තර වෙයි. ඒකාබද්ධ මූල්‍යමය ප්‍රකාශනය සැකසූ අවස්ථාවේදී තිබුනු පරාමිතියන් මත සමාගමේ තක්සේරු සහ උපකල්පන පදනම් විය. වෙළඳපොල වෙනස්කම් හෝ සමාගමේ පාලනයට නතු නොවන පරිදීන් නිසාවෙන් උපකල්පනවල අනාගත විකාශනයන් පිළිබඳව වර්තමාන අදහස් වෙනස් විය හැක. ඒ වෙනස්වීම් සිදුවන අවස්ථාවල උපකල්පන මගින් පරාවර්තනය වේ.

මූල්‍යමය නොවන වත්කම්වල අපචයවීම

වත්කමක හෝ මුදල් ජනන ඒකකයක ධාරණ අගය වත්කමෙන් ආපසු ලබාගත හැකි අගය ඉක්මවා ගිය විට අපචය වීමක් ඇතිවේ. එසේ ආපසු ලබාගත හැකි අගය වන්නේ වත්කමේ සාධාරණ අගයෙන් විකිණීමේ වැය සහ භාවිතයේ යෙදීමෙන් උපයන අගය අඩුකිරීමෙන් ගණනය වන වඩා ඉහල අගය වේ. වගකීමක් සහිතව පූර්ණ විශ්වාසයකින් නොකෙරුනු ඊට සමාන වත්කම්වල විකුණුම් ගණුදෙනු අගය හෝ නිරීක්ෂණය කල හැකි වෙළඳපොල අගයෙන් වැඩිවෙමින් පවතින වත්කම් විකිණීමේ වැය අඩුකිරීමෙන් ගණනය වන අගය මත සාධාරණ අගයෙන් විකිණීමේ වැය අඩුකිරීමෙන් උපයන අගය ගණනය කිරීම සිදුවේ. භාවිතයේ යෙදෙමින් උපයන අගය ගණනය කරනනුයේ වට්ටම් සහිත සංසරණ ආකෘතියක් මත පදනම්වය. මුදල් සංසරණ උකහාගෙන ඇත්තේ ඊලඟ වසර 5 ට සැලසුම් කර ඇති අයවැය මත වන අතර සමාගම දැනට යොදවා නැති ක්‍රියාදමයන් අඩංගු කර නොමැත. දැනට පරීක්ෂණයට යොදවා ඇති **CGU** අදල සැලකිය යුතු අනාගත ආයෝජනවල කාර්ය සාධනයද අඩංගු කර නොමැත.

ආපසු ලබාගත හැකි ප්‍රමාණය වට්ටම් සහිත මුදල් සංසරණ ආකෘතියේ වට්ටම් අනුපාතයට සහ අනාගතය තක්සේරුගත කිරීම සඳහා භාවිතා කරන සමාගම වෙත අනාගත මුදල් සංසරණ සහ ප්‍රසාරණ අනුපාතයට සංවේදි වෙයි.

විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම

විශ්‍රාමික ප්‍රතිලාභ වගකීමේ වියදම සහ විශ්‍රාමික ප්‍රතිලාභ වගකීමේ වත්මන් අගය නිශ්චය කරනුයේ ආයුගණක ආගණනය භාවිතයෙනි. මෙවැනි ආගණනයක් සැබැවින් අනාගතයේ සිදුවිය හැකි විකාශනයන්ට පටහැනි යම් උපකල්පන භාවිතා කර හැක. මෙයට අනාගතයේදී ක්‍රියාත්මක විය හැකි වට්ටම් අනුපාත, වේතන වැඩිවීම්, විශ්‍රාම දීමනා වැඩිවීම් සහ මරණ අනුපාත අනුමාන කිරීම් ඇතුලත් විය හැක. ආගණනයේ සංකීර්ණත්වය, උපකල්පන ස්වභාවය, සහ දිගු කාලීන ස්වභාවය හේතුකොටගෙන නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීම එහි උපකල්පිත කරුණුවල වෙනස්වීම්වලට ඉතාමත් සංවේදී වේ. සෑම වාර්ථාකරන දිනයකදීම උපකල්පන සමාලෝචනයට ලක්වේ.

සුදුසු වට්ටම් අනුපාතය නිගමනය කිරීම පිණිස කළමනාකරණය දිගු කාලීන රජයේ බැඳුම්කරවලට අදල ප්‍රතිලාභ වගකීමේ බලාපොරොත්තු කාල සීමාවට සාපේක්ෂ ඉකුත්වීමේ දින සලකා බැලීමක් කෙරේ. එම බැඳුම්කරවල ගුණාත්මක බව සමාලෝචනය කෙරේ. වේතන සහ විශ්‍රාම ගෙවීම් රටේ උද්ධමන අනුපාත සලකා බලමින් ගණනය කෙරේ.

19.1 සටහනේ භාවිතා කරන ලද උපකල්පන විස්තර කෙරේ.

මූල්‍යමය ප්‍රකාශනවලට අදාල සටහන්

2013 දෙසැම්බර් 31 දී අවසන්වන වසර වෙනුවෙන්

මූල්‍යමය මෙවලම්වල සාධාරණ අගයන්

වට්ටම් සහිත මුදල් සංසරණ ආකෘතියේ මූල්‍යමය තත්ව ප්‍රකාශනය තුල සඳහන්වන මූල්‍යමය වත්කම් සහ මූල්‍යමය බැරකම්වල සාධාරණ අගයන් ක්‍රියාකාරී වෙළඳපොලින් උකහා ගැනීමට නොහැකිවන අවස්ථාවල සාධාරණ අගයන් නිගමනය කිරීම කෙරෙන්නේ වට්ටම් සහිත මුදල් සංසරණ ආකෘතිය වැනි ආගණනය තාක්ෂණය භාවිතයෙනි. මෙම තාක්ෂණයට ඇතුලත් කිරීමේ දත්ත හැකි පමණින් නිරීක්ෂණය කල හැකි වෙළඳපොලවලින් ගනු ලැබේ. මෙය ප්‍රායෝගික නොවන අවස්ථාවල සාධාරණ අගයන් ගණනය කිරීම සඳහා සැලකිය යුතු ප්‍රමාණයක නිශ්චය කිරීමක් අවශ්‍යවේ. මෙම නිශ්චය කිරීම්වලට ද්‍රවශීලතා අවදානම්, බැරකම් වල අවදානම්, චංචලතාවයන් ඇතුලත්වේ. මෙම උපකල්පනවල වෙනස්වීම් මූල්‍යමය මෙවලම්වල වාර්ථාගත සාධාරණ අගයන් කෙරෙහි බලපෑ හැක.

3. නිකුත් කරන ලද එනමුත් තවමත් ක්‍රියාත්මක නොමැති ප්‍රමිතීන්

පහත දැක්වෙන්නේ මෙම මූල්‍යමය ප්‍රකාශනය නිකුත් කෙරූ දිනය වන තෙක් ක්‍රියාත්මකවී නොමැති එසේ නමුත් නිකුත් කර ඇති ප්‍රමිතීන් වෙති. මෙම ප්‍රමිතීන් ක්‍රියාත්මක වන දිනය පටන් සමාගම මේවාට අනුකූල වීමට සැදී පැහැදී සිටී. විස්තීර්ණ සමාලෝචනයක් කරන තුරු මෙම මූල්‍යමය ප්‍රකාශනය නිකුත්වුනු දින තෙක් පවතින බැවින් මෙම ප්‍රමිතීන් ආශ්‍රයෙන් ඇතිවන මූල්‍යමය බලපෑම තක්සේරු කිරීම අපහසුවේ.

SLFRS 9 - මූල්‍ය මෙවලම් වර්ගීකරණය සහ ගණනය කිරීම

SLFRS 10 - ඒකාබද්ධ මූල්‍යමය ප්‍රකාශනය

SLFRS 11- ඒකාබද්ධ සැලසුම්

SLFRS 12 - අනෙකුත් ආයතන කෙරෙහි ඇති ලැදියාව අනාවරනය කිරීම

SLFRS 13 - සාධාරණය අගයන් ගණනය කිරීම

2015 ජනවාරි 01 සිට ඇරඹෙන මූල්‍යමය කාල සීමාවට SLFRS 9 බලපාන්නට නියමිතවී ඇති අතර 2014 ජනවාරි 01 සිට ඇරඹෙන මූල්‍යමය කාල සීමාවට SLFRS 10,11,12 සහ 13 බලපාන්නට නියමිතවී ඇත.

මූල්‍යමය ප්‍රකාශනවලට අදාල සටහන්

2013 දෙසැම්බර් 31 දී

4. ආදායම

	2013 රුපියල්	31.12.2012 අවසන් වන තෙමසට රුපියල්
4.1 සංක්ෂිප්තය		
භාණ්ඩ විකිණීම	5,747,048,373	1,474,174,439
	5,747,048,373	1,474,174,439
4.2 පහත සඳහන් අයුරින් ආදායම උපැයේ:		
සීනි	2,811,827,420	1,180,426,793
රෝට	19,171,770	257,920
ඊ ඇන් ඒ	2,916,049,183	293,489,726
	5,747,048,373	1,474,174,439

5. අනෙකුත් ආදායම් සහ ලාභ

	2013 රුපියල්	31.12.2012 අවසන් වන තෙමසට රුපියල්
අනෙකුත් සේවා ආදායම්	42,795,184	15,490,096
අමතර ආදායම්	7,393,906	15,391
පූර්ව කළමනාකරණය වෙත පැවරීමෙන් ලාභය	3,089,670	2,556,013
	53,278,760	18,061,501

6. මූල්‍ය වියදම් සහ ආදායම්

	2013 රුපියල්	31.12.2012 අවසන් වන තෙමසට රුපියල්
6.1 මූල්‍ය වියදම්		
බැංකු ණය සඳහා පොලි වියදම්	3,837,782	-
බැංකු අයිරාවන් සඳහා පොලි වියදම්	28,289,975	859,333
බදු බැරකම් සඳහා මුදල් සැපයීමේ ගාස්තු	185,559	359,914
	32,313,316	1,219,246
6.2 මූල්‍ය ආදායම		
ගොවීන්ගෙන් අයවිය යුතු ණය සඳහා පොලි	25,241,963	2,160,873
තැන්පතු වලින් පොලී ආදායම්	110,791,383	18,396,523
